2007 ජනවාරි 22


දීර්ඝ නාමය . . . . . . . . .. . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . .. . . . .. . . . .
පූර්විකාව . . . . .. . .. .. . . . . . .. . . . . . . . .. . . . . . . . . . . . . . . .. . . . . . ..
ලුහුඬු නාමය .. . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . .. . . . . . . . . . ..

1 වන කොටස : මූලික විධිවිධාන සහ විෂයපථය . .. . . .. . . . . . . . ..
පනතේ අරමුණු . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . ..

II වන කොටස : මානසික සෞඛ්‍යය සම්බන්ධ අයිතිවාසිකම් සහ යුතුකම් .. .. .

මෙම කොටස අදාළ කර ගැනීම .. . . . .. . . . . . . . . . . . . . . . . . .. . . . . . . . .. . ..
වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවීමේ සහ
වෙනත් අයිතිවාසිකම් . . . . . . .. . .. . . . . . .. . .
මූලික සත්කාරකයන්ගේ අයිතිවාසිකම් . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
මානසික සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ තීරණ . . . . . . . . . . . . . . .. . . . . . . . . .
මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නන්ගේ ගෞරවය,
මානව අභිමානය සහ පෞද්ගලිකත්වය . . . . . . . . .. . . . . . .. . . . . . .. . .
ඖෂධවලට ප්‍රවේශය . .. . . . . . . . . . . . . . . . . . . .. . . . .. . . . . . . . .. ..
මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානවල සිටින නේවාසික
රෝගීන්ගේ ශාරීරික සෞඛ්‍යය . . . . . .. . . . . .. . . . . . .. . . . .. . . . . . .
සත්කාරය, ප්‍රතිකාර, අඛණ්ඩ සත්කාරය සහ පුනරුත්ථාපනය
හා මානසික සෞඛ්‍ය පහසුකම් ආයතනයකට ඇතුල්වීම සඳහා කැමැත්ත අවශ්‍යවීම. . . . .
සූරාකෑම සහ අපයෝජනය . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . ..
රහස්‍යභාවය, වාර්තා සහ තොරතුරුවලට ප්‍රවේශය . . . . . .. . . . . . . . .. . . . . . . .
නියෝජනය කරනු ලැබීමේ අයිතිවාසිකම . . . . . . . . . .. . . . . . . . . . . . . .. . .
ගිවිසුම්වලට එළඹීමට රෝගීන්ට ඇති හැකියාව .. . . . . .. . . . . . . . . .. . . . . . .
මුදාහැරීමේ වාර්තා සහ යොමු කිරීම්. . . . . . .. . . . . . .. . . . .. . . . . .. . . . . . .. . . . . ..
යොමු කිරීම් . . . . . .. . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . .. .
තුවාල හෝ මරණය අනිවාර්යයෙන් වාර්තා කිරීම . . . . . . .. . . . . . . . . . .. . . . .. .
අයිතිවාසිකම් පිළිබඳ පූර්ණ දැනීම . . . . . .. . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . ..

III වන කොටස - අවශ්‍ය මානසික සෞඛ්‍ය සේවා සහ පහසුකම්.
ප්‍රවර්ධනය, වැළැක්වීම සහ ප්‍රජා සේවා . . . . . .. . . . . . .. . . . . . . . . . . . . . . .. . . .
පුහුණුව සහ කුසලතා සංවර්ධනය සම්බන්ධ ප්‍රමිති . . . . . . .. . . . . .. . . . . . . . .. . . . . . .. .. . .
අවශ්‍ය පහසුකම් . . . .. . . . . . . . .. . . . . . .. . . . . . . . . . .. . . . . .. . . . . . . . . . .
යොමු කිරීම් පද්ධතිය . . .. . . . . .. . . . . . . .. . . . . . . . .. . . . . . . .. . . . . . . . . . .

කාර්ය මණ්ඩල සැපයීම සහ ප්‍රමිති . . . .. . . . . . . . . . . . .. . . . . . . . . . .. . . . .
සත්කාරකයන් සඳහා සේවා සහ වැඩ සටහන් . . . . . . . .. . . . . . . .. . . . . . . . . ..

## iVවන කොටස ඉච්ඡානුග ඇතුලත් කිරීම . . . . . .. . . . . . . . . . . . . .. . . . . . .

ඉච්ඡානුග ඇතුලත් කිරීම .. .. . . . .. . .. . . . . . . . . .. . . . . . . . . . . . .. . . . .. . . . .. .
ඉච්ඡානුග රෝගියකු නිදහස් කිරීම . . . .. . . . . . .. . .. . . . . . . .. . . . . . .. . . . . . . . .. .
වයස අවුරුදු දහඅටට අඩු ඉච්ඡානුග රෝගීන් පිළිබඳ වාර්තා . . . .. . . . . . . . . . . . ..

## V වන කොටස අනිච්ඡානුග සහ හදිසි ඇතුළත් කිරීම . . . . . . . . . . . . .

අනිච්ඡානුග සහ හදිසි ඇතුළත් කිරීම . . .. . . . . . . .. . . . . . . . .. . . . . . . . . .. . . . . . . .
අනිච්ඡානුග සහ හදිසි ඇතුළත් කිරීම් සම්බන්ධ අභියාචනා . . . .. . . . . . . . . .. . . . .
රෝගීන්ගේ නියෝජිතයන් පත්කිරීම . . . . . . . . . . . . . .. . . . . . . . . . . . .. . ..
අනිච්ඡානුග රෝගීන් පිළිගත යුත්තේ
බලපත්‍රයක් ඇත්නම් පමණකි . . . . . .. . . . . . . . . . . . .. . . . . . . .
ඇතැම් නඩු සම්බන්ධයෙන් පොලීසියට ඇති බලතල
සහ වගකීම . . . . . . . .. . . . . . . . . . . .. . . . . . . . .. . . . . . . . . . .

## VI වන කොටස : රඳවා තබාගැනීම සහ අනිච්ඡානුග හා හදිසි ප්‍රතිකාර

මානසික අසනීප ඇති රෝගීන් ඇතුළත් කර ගැනීමෙන් පසු
රඳවා තබාගන්නා කාල පරිච්ඡේදය . . . . . . .. . . . . . . . . . . . . .
මාස තුනක කාලයක් රඳවා තබාගැනීම . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . .
මාස හයක් ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ගැනීම
සඳහා ඉල්ලුම්පත්‍රය . . . .. . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . .
අනිච්ඡානුග සහ අඛණ්ඩ ප්‍රතිකාර . . . .. . . . . . . .. . . . . . . .. . . . . . . . . .. . . . . . . . . . . . .. . .
හදිසි ප්‍රතිකාර . . . . . .. . . . . . . . . . . . . . . . . . . .. . . . . . .. . . . . . . .. . . . . . . . . . . .
වෙන්කර තැබීම . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. .. . . . . . . . . . .
රෝගියාට, ඔහුගේ හෝ ඇයගේ ලඟම නෑයාට හෝ
භාරකරුට දැනුම්දීම . . .. . . . . . . . .. . . . . . . . .. . . . . . . . . . .
රඳවා තබාගැනීම සහ අනිච්ඡානුග ප්‍රතිකාර සඳහා අභියාචනය . . . . . . . . . . . . . . . .

## VII වන කොටස : අලුත් කිරීමේ සහ නිදහස් කිරීමේ කාර්ය පටිපාටිය


අලුත් කිරීමේ කාර්ය පටිපාටිය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
ආරෝග්‍ය ශාලාවෙන් බැහැරව සිටීමේ අවසරය . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
නිවාඩු නොමැතිව පැමිණ නොසිටින රෝගීන්,
ආපසු පැමිණීම සහ නැවත ඇතුළත් කර ගැනීම . . . . . . . . . . . . . . . . . . . . .
අනිච්ඡානුග තත්ත්වයේ සිට ඉච්ඡානුග තත්ත්වයට
රෝගියා වෙනස් වීම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
රඳවා තබාගත් රෝගියකු නිදහස් කිරීම සඳහා වූ
ඉල්ලුම් පත්‍රය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
නිදහස් කිරීමේ කාර්ය පටිපාටිය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .


## VIII වන කොටස : මානසික රෝගී සිරකරුවන් . . . . . . . . . . . . . . . . .


සිරගෙදර හෝ බන්ධනාගාරයක දණ්ඩන නියමයකට යටත්ව සිටින
සිරකරුවන්ට මානසික අසනීපයක් ඇතිවූ විට රෝහලට ගෙන යායුතු බව . . . . . . . . .
මානසික සෞඛ්‍යය වර්ධනයවීමෙන් පසුව රඳවා තැබීමෙන් නිදහස් කිරීම . . . . . . . . . . .
අදාළ තැනැත්තා සුවපත් නොවූයේ නම්, දණ්ඩන නියමය ඉකුත්වූ පසු
තවදුරටත් කළයුතු කටයුතු . . . . . . . . . . . . . . . . . . . . . . . . .
රඳවා තබාගනු ලැබූ රෝගීන්ගේ දේපළ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .


## IX වන කොටස : මානසික රෝගී සැකකාර වරදකරුවෝ . . . . . . . . . .


අපරාධ නඩු විභාගයක් සම්බන්ධයෙන් පොලිස් අත්අඩංගුවේ හෝ රක්ෂිත
බන්ධානාගාරගතව තබා සිටින මානසික අසනීපයෙන් පෙළෙන තැනැත්තන් . . . . . . .
රෝහලට ඇතුළත් කිරීම සඳහා වූ ඉල්ලීම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
තක්සේරුව . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
මානසික රෝගී සැකකාර වරදකරුවන් රෝහලක රඳවා තබාගැනීම . . . . . . . . . . . . .
මානසික රෝගී සැකකාර වරදකරුවන් රඳවා තැබීමෙන් නිදහස් කිරීම . . . . . . . . . . . .


## X වන කොටස : මානසික සෞඛ්‍ය සභාව පිහිටුවීම


මානසික සෞඛ්‍ය සභාව පිහිටුවීම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
සංයුතිය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
සභාවේ කාර්යයන් . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
සභාවේ බලතල . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
පාර්ලිමේන්තුව වෙත යවන වාර්තා . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

රැස්වීම් .. . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . .. . . . . . . . . . . .
කාර්ය මණ්ඩලය . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . .
සභාවේ වියදම් . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . .. .
දුක්ගැනවිලි කමිටුවේ තීරණ පිළිබඳ අභියාචනා . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . ..

## XI වන කොටස : දිස්ත්‍රික් සමාලෝචන කමිටු පිහිටුවීම

දිස්ත්‍රික් සමාලෝචන කමිටු පිහිටුවීම . . . . . .. . . . . . . . . . . . . . . . .. . . . . .. . . . . . .. . . .
කමිටුවල බලතල සහ කාර්යයන් . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . .
කමිටුවක් වෙත කෙරෙන අභියාචනා . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . .. . . . . . . . ..
කමිටු තීරණ සම්බන්ධ අභියාචනා . . . . . . . . . .. . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . .
කමිටුවකට යොමු කිරීම සඳහා අමාත්‍යවරයා සතු බලතල . . . . . .. . . . . . . . . . . . . . . . .

## XII වන කොටස : වෙනත් නීති අදාළ කර ගැනීම . . . . . . . . . . . . .. . . . . . . .. . . . .

භාරකරුවන් පත් කිරීම සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ
XXXIX වන පරිච්ඡේදය සහ XL වන පරිච්ඡේදය අදාළ කර ගැනීම.
අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ xxxi වන
පරිච්ඡේදය අදාළ කර ගැනීම . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . .
අධිකරණ සංවිධාන පනතේ iv වන පරිච්ඡේදය
අදාළ කර ගැනීම . . . . . . . . . . . . . . . . . . . . . . . . . ..

## XIII වන කොටස : පොදු .. .. . . .. . . . . . . . . . .. . . . . . . . . . . .. . . . . . . .. . . . . .

නීති කෘත්‍යයන් මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු බව . . . . . . .. . . . . . . . . . . . . . . . . . .
වරදවල් . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . .. .
ව්‍යාජ, සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශන හෝ ප්‍රකාශ . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . .
රෝගීන් සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීම . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . .
අභියාචනාධිකරණය වෙත අභියාචනා . . . . .. . . . . . . . .. . . . . . . .. . .. . . . . . . .. . . . . .
රෙගුලාසි .. . . . . . .. . . . .. . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . .. . . .
උපලේඛනයේ ඇති ආකෘතිපත්‍ර වෙනස්කිරීම සඳහා බලය . . . . .. . . . . .. . . . . . . .. . . . . . ..
යම් ලිඛිත නීතියක " සිහිවිකලත්වය " සහ " මානසික අඩුපාඩුකම් සහිත
පුද්ගලයකු " යන වචන වෙනුවට මානසික අසනීපය යන වචන
ආදේශ කිරීම . . . .. . . . . . . . .. . . . . . . .. . . . . . . . . . .. . . .. . . . . . .. . . . . . . . . .. .
අවලංගු කිරීම් . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. .. . . . . . . . . .
අන්තර් කාලීන විධිවිධාන . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
අනනුකූලතාවයක් ඇති වුවහොත්, සිංහල භාෂා පාඨය
බලපැවැත්විය යුතු බව . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . .
අර්ථ නිරූපනය . . . . . . . .. . . . . . . . . . . . . . . . .. . .. . . . . . . . . . . . . .. . . . .

දීර්ඝ නාමය

මානසික අසනීප ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ; මානසික අසනීප ඇති තැනැත්තන්ට සත්කාර , ප්‍රතිකාර, අඛණ්ඩ සත්කාරය සහ පුනරුත්ථාපනය සඳහා විධි විධාන සැලැස්වීම; මානසික සෞඛ්‍ය උපදේශක සභාව සහ දුක්ගැනවිලි කමිටුව පිහිටුවීම ; දිස්ත්‍රික් සමාලෝචන මණ්ඩල පිහිටුවීම (559 වන අධිකාරය වූ) මානසික අසනීප ආඥාපනත අහෝසි කිරීම; සහ ඊට සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ හෝ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව

සෞඛ්‍යය යනු භෞතික, මානසික සහ සාමාජික යහපත සම්බන්ධ තත්ත්වයක් බව සහ මානසික සෞඛ්‍යය, ප්‍රාථමික, ද්විතියික හෝ තෘතීය සෞඛ්‍ය සේවාවල කොටසක් වශයෙන් ලබාදිය යුතු බව පිළිගනිමින් ද ;

මානසික යහපත පුද්ගලයන්ගේ, පවුල්වල, ප්‍රජාවන්ගේ සහ රටේ මානසික යහපත, පුද්ගලයන්ගේද, පවුල්වලද, ප්‍රජාවන්ගේද, රටේ ද, ජීවිතයේ ගුණාත්මක බවට මූලික වන සහ මානසික සෞඛ්‍ය සේවාවන් මගින් ජනතාවගේ යහපත සහ ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමටද, ඔවුන් ප්‍රකෘති තත්ත්වයට පත්වීම ශක්තිමත් කිරීමටද , සමාජ අනුකලනය බලගැන්වීම, සමාජ සහාය සහ සහභාගීත්වය , සමාජ සේවා සහ සමාජ වගකීම වැනි ආරක්ෂාකාරී බාහිර සාධක වැඩිදියුණු කිරීමටද, උත්සාහ කළයුතු බව පිළිගනිමින් ද ;

මානසික සෞඛ්‍ය ගැටළුද, කොන්කිරීම, රැකියා වියුක්තිය, මත් ද්‍රව්‍ය සහ මධ්‍යසාර අපයෝජනය, මන්දපෝෂණය, අසාධාරණය සහ වෙනස්කම්පෑම, අවතැන්වීම, යුද්ධය, ස්වභාවික ආපදා, ප්‍රචණ්ඩත්වය සහ දරිද්‍රතාවය වැනි ගැටළු ඇතිවන සමාජ සන්දර්භය ද අතරේ පවත්නා හානිදායක සම්බන්ධතාවන් ද සැලකිල්ලට ගනිමින්ද ;

අවමන් සහගත සැලකිල්ලෙන් සහ වෙනස්කම් පෑමෙන් නිදහස, නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වය, සහ පුරවැසියන්ගේ ආරක්ෂාව සඳහා 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන සහ 12 වන ව්‍යවස්ථා මගින් විධිවිධාන සලස්වා ඇතිබව පිළිගනිමින්ද ;

දුබල තැනැත්තන්ගේ සුභසාධනය ඉහළ නැංවීම සඳහා 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන

ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලස්වා ඇති බව පිළිගනිමින්ද,

සත්කාරය

සියළුම තැනැත්තන්ගේ මානව සහ දේපළ අයිතිවාසිකම් සඳහා ගෞරවය සහ ආරක්ෂාව අවශ්‍ය බවද, ඇතැම් අවස්ථාවලදී මානසික අසනීප ඇති තැනැත්තන් විසින් ඔවුන්ගේ මානසික අසනීපවල ප්‍රතිඵලයක් ලෙස , සෙසු අයටද, ඔවුන්ගේ දේපළවලටද, හානි සිදු කිරීමෙන් ඔවුන් වැළැක්වීම අවශ්‍ය විය හැකි බව පිළිගනිමින්ද ,

අවදානමට ලක්ව සිටින කණ්ඩායම්වල සහ මානසික සෞඛ්‍ය සේවාවන් භාවිතා කරන්නන්ගේ තවදුරටත් සාමාන්‍ය ජනතාවගේ ප්‍රශස්ථ සුභසාධනය ප්‍රවර්ධනය කෙරෙන ආකාරයකට මානසික සෞඛ්‍ය සේවාවන් සැපයීම සහ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් ඇතිබව පිළිගනිමින්ද,

මානව රෝග ආඥාපනත පරිච්ඡින්න කිරීමද ; මානසික යහපත වර්ධනය කිරීම සහ ආරක්ෂාකිරීමද ; මානසික රෝග වැළැක්වීම ; මානසික අසනීප ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් සහ දේපළ ආරක්ෂා කිරීමද ; මානසික අසනීප ඇති තැනැත්තන් සඳහා ප්‍රජා සත්කාරය සැලැස්වීම උනන්දු කරවීමද ; ගුණාත්මක සත්කාර අසනීපවලින් පෙළෙන අයගේ පුනරුත්ථාපන සේවාවන් සැපයීමද යෝග්‍යවන හෙයින් ද.

එසේ හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩු නාමය

1. මෙම පනත, 2006 අංක . . . . . . .. . දරණ මානසික සෞඛ්‍ය පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

1. වන කොටස : මූලික විධිවිධාන සහ විෂය පථය

පනතේ අරමුණු

2. මෙම පනතේ අරමුණු වනුයේ :

අ) මානසික සෞඛ්‍යය සම්බන්ධ අයිතිවාසිකම් සහ යුතුකම් දැක්වීම ;

ආ) මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන සේවාවන් සහ වැඩසටහන් ඇතිකිරීම ; මානසික අසනීප වැළැක්වීම, ඊට ප්‍රතිකාර කිරීම සහ ඒ

පිළිබඳව ආරක්ෂාව සැලැස්වීම; සහ පුනරුත්ථාපනය ;

ඇ) (i) ස්වේච්ඡා, ස්වේච්ඡා නොවන සහ හදිසි මානසික සෞඛ්‍ය සේවා භාවිතා කරන්නන්ට ; සහ

(ii) මානසික සෞඛ්‍ය සේවාවන් අවශ්‍යවන වරදකරුවන්ට සහ සිරකරුවන්ට

මානසික සෞඛ්‍ය සේවාවන්ට ඇති ප්‍රවේශය විධිමත් කිරීම සහ එම සේවා ලබාදීම ;

ඇ) ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය සේවා පද්ධතිය විධිමත් කිරීම පිණිස මානසික සෞඛ්‍ය උපදේශක සභාවක්/ දුක්ගැනවිලි කමිටුවක් දිස්ත්‍රික්ක සමාලෝචන කමිටු පිහිටුවීම.

## 11 වන කොටස : මානසික සෞඛ්‍යය සම්බන්ධ අයිතිවාසිකම් සහ යුතුකම්

මෙම කොටස අදාළ කර ගැනීම

3. මෙම කොටසෙහි දක්වා ඇති පරිදි පුද්ගලයන්ගේ පුද්ගල මණ්ඩලවල හෝ ආයතනවල අයිතිවාසිකම් සහ යුතුකම් ඇත්තේ,

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන සහ 12 වන ව්‍යවස්ථා යටතේ අවමන් සහගත සැලකිල්ලෙන් සහ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය වීමෙන් නිදහස නීතිය ඉදිරියේ සමානත්වය සහ පුරවැසියන්ගේ ආරක්ෂාව;

(2) රැකියා නියුක්තිය පාලනය වන පවත්නා නීතිය යටතේ අයිතිවාසිකම්; සහ

(3) අශක්නුතාවන් පාලනය කෙරෙන පවත්නා නීති යටතේ අයිතිවාසිකම්,

ඇතුළු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අදාළ වන වෙනත් යම් ලිඛිත නීතියක ප්‍රකාර ඔවුන්ට තිබිය හැකි , කවරවූ හෝ අයිතිවාසිකම්වලට සහ යුතුකම්වලට අතිරේක වශයෙනි.

වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවීම සහ වෙනත් අයිතිවාසිකම්.

4 (1) තැනැත්තන්ට, ඔවුන්ගේ මානසික සෞඛ්‍ය තත්ත්වය යන හේතුව මත වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය කරනු නොලැබීමේ අයිතිවාසිකම ඇත්තේය.

(අ) " වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය කරනු ලැබීම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් නීති යටතේ, අයිතිවාසිකම් සමානව භුක්ති විඳීමට හානි පැමිණවීමේ ප්‍රතිඵලයක් ගෙනදෙන යම් ප්‍රභේදයක්, බැහැර කිරීමක් හෝ වරණයක් අදහස් කෙරේ.

(ආ) හුදෙක්ම මානසික අසනීප ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හෝ අභිවර්ධනය සඳහා උපයෝගී කරගනු ලබන විශේෂ ක්‍රියාමාර්ග, වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය කරනු ලැබීමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, මානසික අසනීපයක් ඇති තැනැත්තන් රැකියාවල යෙදවීම නියෝග මගින් ප්‍රවර්ධනය කළයුතුය.

(1) මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජන ලබන්නාවූ සෑම තැනැත්තෙකුටම , වෙනත් කවර වූ හෝ සෞඛ්‍ය සත්කාරවල ප්‍රයෝජනය ලබන්නෙකුට අදාළ වන සත්කාරය ,ප්‍රතිකාර අඛණ්ඩ සත්කාර සහ පුනරුත්ථාපන සේවාවන් ලැබිය යුතුය.

(2) මානසික අසනීපයක් ඇත්තාවූ හැම තැනැත්තෙකුටම, ඔහු හෝ ඇය ජීවත්වන ප්‍රජාව තුළ ජීවත්වීමේ, වැඩෙහි යෙදීමේ, ප්‍රතිකාර කරනු ලැබීමේ සහ සත්කාරය සලස්වනු ලැබීමේ අයිතිවාසිකම තිබිය යුත්තේය. ප්‍රතිකාර කිරීම මනෝ චිකිත්සක ඒකකයකදී සිදුවන්නේ නම්, රෝගියෙකුට ඔහුගේ හෝ ඇයගේ නිවසට හෝ ඔහුගේ හෝ ඇයගේ නැදෑයින්ගේ හෝ මිත්‍රයින්ගේ නිවසට ඉතාමත් ආසන්නයේදී ප්‍රතිකාර කරනු ලැබීමේ අයිතිවාසිකම තිබිය යුතු අතර, හැකිතරම්

ඉක්මනින් තම ප්‍රජාව වෙත ආපසු පැමිණීමේ අයිතිවාසිකම ඔහුට/ ඇයට තිබිය යුතුය.

**ප්‍රාථමික සත්කාරකයන්ගේ වගකීම**

5. මානසික අසනීපයක් ඇති තැනැත්තන්ගේ මූලික සත්කාරකයන් ලෙස සහතික කරනු ලැබූ තැනැත්තන්ට, දුබලතා රෙගුලාසිවලට අනුව, ඔවුන්ගේ සේවා යෝජකයින්ගෙන් විශේෂ ප්‍රතිෂ්ඨාවක් ලැබීමේ අයිතිවාසිකම තිබිය යුත්තේය.

**මානසික සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ තීරණ**

6. යම් තැනැත්තෙකුගේ මානසික සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් කරනු ලබන යම් තීරණයක්, මානසික සෞඛ්‍ය සභාව විසින් පනවනු ලබන රෙගුලාසිවලට අනුව අන්තර්ජාතිකව පිළිගත් වෛද්‍ය ප්‍රමිතීන් මත පදනම් විය යුතුය.

**මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නන්ගේ මානව අභිමානයට සහ පෞද්ගලිකත්වයට ගෞරව කිරීම.**

7. හැම තැනැත්තෙකුටම ඔවුන්ගේ මානසික තත්ත්වය, නොසලකාම ඔවුන්ගේ ශරීරයට , මානව අභිමානයට, පෞද්ගලිකත්වයට සහ සංස්කෘතික සහ ආගමික විශ්වාසවලට ගෞරවයෙන් යුතුව සලකනු ලැබීමේ අයිතිවාසිකමක් ඇත්තේය.

**බෙහෙත්වලට ප්‍රවේශය**

8. මානසික අසනීපයක් ඇති හැම තැනැත්තෙකුටම, අවශ්‍ය බෙහෙත් වලට ප්‍රවේශයක් තිබීමේ අයිතිවාසිකම ඇත්තේය

**මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථාන වල සිටින නේවාසික රෝගීන්ගේ ශාරීරික සෞඛ්‍යය**

9. මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානවල සිටින සියළුම රෝගීන්, නියමිත නියෝගවලට අනුව (ශාරීරික හෝ මානසික) සම්පූර්ණ සායනික පරීක්ෂණයකට භාජනය කරනු ලැබිය යුතුය.

10. මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානයක සිටින රෝගියෙකුට, කලින් පැවතියාවූ හෝ, අළුතින් හඳුනාගනු ලැබූවාවූ හෝ ශාරීරික අසනීපයක් සම්බන්ධයෙන් ඔහු එහි නැවතී සිටින කාලය තුළ සම්මත කළමණාකාරීත්වයක් සහ පසු විපරම් ආරක්ෂාවක් සඳහා යොමු කිරීමක් ලැබීමේ අයිතිවාසිකම තිබිය යුත්තේය.

**මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නන්ගේ දේපළ**

11. මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජන ලබන්නාවූ සියළුම තැනැත්තන්ගේ දේපළ නියමිත නියෝගවලට අනුව පරිපාලනය කරනු ලැබිය යුතුය. එම තැනැත්තා උපන් දිස්ත්‍රික්කයේ හෝ දේපළ පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිසා අධිකරණයේ අනුමැතිය

නොමැතිව වෙනස් නොකළ යුතුය. දිසා අධිකරණ විසින් එබදු දේපළ, මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නන්ගේ ඉහළම යහපතට සර්ලන ආකාරයට පර්පාලනය කළ යුතුය.

12. මානසික සෞඛ්‍ය පහසුකම් භාවිතා කරන්නන් සියලුදෙනාගේම දේපල අයිතිවාසිකම් එම තැනැත්තන් උපන් දිස්ත්‍රික්කයේ හෝ දේපල පිහිටි අධිකරණ බලසීමාව අයත් වන දිසා අධිකරණය විසින් ආරක්ෂා කරනු ලැබිය යුතුය.

සත්කාරය, ප්‍රතිකාර, අඛණ්ඩ සත්කාරය සහ පුනරුත්ථාපනය හා මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානයකට ඇතුල්වීම සඳහා කැමැත්ත අවශ්‍ය වීම

13. (1) ඇතුළත් කරගනු ලබන අවස්ථාවේදී වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කරවාගනු ලැබීමේ සහ කැමැත්ත දීමට, තීරණ ගැනීමට සහ ගිවිසුම්වලට ඇතුළත්වීමට රෝගියකුට ඇති හැකියාව නිශ්චය කරවා ගැනීමේ අයිතිවාසිකම හැම රෝගියෙකුටම තිබිය යුතුය. ඉන් අනතුරුව, නියමිත නියෝග වලට අනුව, නියමිත කාලයෙන් කාලයට, රෝගියෙකුගේ හැකියාව ඇගයීමට ලක් කළ යුතුය.

(අ) රෝගියාගේ හැකියාව පිළිබඳ මතයක් පදනම්කරගත යුත්තේ රෝගියෙකු පෞද්ගලිකව පරීක්ෂා කිරීම මතය.

(ආ) වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂණය පවත්වා නිගමනයේ පදනම වශයෙන් නිශ්චිත සාක්ෂි ද ඇතුළුව, රෝගියාගේ, හැකියාව සම්බන්ධයෙන් නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

(ඇ) හැකියාව සම්බන්ධ නිගමනයක් පිළිබඳව අභියාචනයක් මෙම පනතේ XI කොටස අනුව පිහිටුවා ඇති , දිස්ත්‍රික් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(1) යම් මානසික අසනීපයක් ඇති තැනැත්තෙකුට ඔහුගේ හෝ ඇයගේ දැනුම්දුන් කැමැත්තෙන් තොරව ප්‍රතිකාර ලබානොදිය යුතුය.

සූරාකෑම සහ අපයෝජනය

14. (1) සූරා කෑමට, ශාරීරික හෝ වෙනත් අපයෝජනයකට, නොසලකා හැරීමකට හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම්වලට හෝ භාජනය කරනු ලැබීමෙන් තොරව, සේවාවක් ලබාගැනීමේ අයිතිවාසිකම , හැම

මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නාවූ හැම කෙනෙකුටම තිබේ.

(2) ඒ අනුව, මානසික සෞඛ්‍ය සේවාවන් ලබාදෙන හැම තැනැත්තෙකුම, පුද්ගල මණ්ඩලයක්ම, සංවිධානයක්ම හෝ සෞඛ්‍ය ආයතනයක්ම -

(අ) මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනව ලබන්නා, බලයෙන් ශ්‍රමය ලබාගැනීමට භාජනය කරනු නොලබන බවට;

(ආ) මානසික සෞඛ්‍ය සේවාවන් සපයනු ලබන්නේ, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීමේ කාර්යයන් සඳහා මිස දඬුවම් කිරීමක් හෝ වෙනත් අයගේ පහසුව සඳහා නොවන බවට;

(ඇ) මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නන්, වෙනත් යම් තැනැත්තෙකු විසින් ශාරීරිකව හෝ වෙනත් ආකාරයකින් අපයෝජනයකට ලක්කරනු නොලබන බවට ; සහ

(ඇ) මානසිත සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජනය ලබන්නන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන බවට ;

වගබලා ගැනීම පිණිස හැම සාධාරණ පියවරක්ම ගතයුතුය.

(3) මානසික සෞඛ්‍ය සේවයේ ප්‍රයෝජනය ලබන්නෙකු සූරාකෑම, භෞතික හෝ වෙනත් අපයෝජනය, නොසලකා හැරීම සහ අවමන් සහගත සැලකිල්ලකට භාජනය කිරීම දකින සෑම තැනැත්තෙකුම, අපයෝජනය සිදුවේ යයි කියනු ලබන දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් සමාලෝචන කමිටුව වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව, සූරාකෑම, භෞතික හෝ වෙනත් අපයෝජන සිදුවේ යයි සැක කරනු ලබන මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජන ලබන්නන්, හෝ, ඔවුන්ගේ ලඟම නෑයා, භාරකරු හෝ වෙනත් තුන්වන පාර්ශ්වයක් විසින් මෙම වගන්තිය යටතේ , පැමිණිලි ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

රහස්‍යභාවය, වාර්තා, සහ තොරතුරුවලට ප්‍රවේශය.

15. තැනැත්තන් සහ ඔවුන්ගේ අසනීප හෝ ප්‍රතිකාර ගැන කිසිම තොරතුරක්, මානසික සෞඛ්‍ය සේවයේ ප්‍රයෝජනය ලබන්නන්ගේ කැමැත්ත නොමැතිව, කිසිම තැනැත්තකු හෝ සෞඛ්‍ය පහසුකම්

ස්ථානයක් විසින් තුන්වන පාර්ශ්වයන්ට එළිදරව් නොකළයුතුය.

එතෙකුදු වුවද, මෙම උපවගන්තියෙන් අදහස් කෙරෙන තොරතුරු අදාළ සෞඛ්‍ය පහසුකම් ස්ථානයේ ප්‍රධානයා විසින් :-

(1) ඉල්ලා සිටිනු ලැබූ විට අධිකරණයකට ;

(2) මානසික සෞඛ්‍ය සේවයේ ප්‍රයෝජනය ලබන්නාගේ සුභ සාධනය හෝ වෙනත් අයගේ සෞඛ්‍යය සඳහා, අදාළ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ආයතනයකට ; හෝ

(3) තුන්වන පාර්ශ්වයක සුභසාධනයට අත්‍යාසන්න අවදානමක් පවත්නා අවස්ථාවකදී, පොලීසියට හෝ තර්ජිත තුන්වන පාර්ශ්වයකට, හෝ

එළිදරව් කරනු ලැබිය හැකිය.

16. රෝගියාගේ සෞඛ්‍යය සම්බන්ධ තොරතුරුවලට සහ මානසික සෞඛ්‍ය පහසුකම් ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික වාර්තාවලට ප්‍රවේශයක් ලැබීමේ , අයිතිවාසිකමක් වර්තමාන හෝ කලින් සිටි රෝගියකුට තිබිය යුත්තේය. යම් රෝගියකුට තමාගේ වාර්තාවට ඇති ප්‍රවේශය නියමිත නියෝග වලට අනුකුල විය යුතුය.

නියෝජනය කරනු ලැබීමේ අයිතිවාසිකම

17. නෑදෑයකු හෝ වෙනත් නියෝජිතයකු විසින් ආධාර කරනු ලැබීමේ අයිතිවාසිකමක්, මානසික සෞඛ්‍ය සේවය පාවිච්චි කරන්නෙකුට පනත යටතේ ඔහුගේ හෝ ඇයගේ අයිතිවාසිකම් අනුව ඇත්තේ ය.

ගිවිසුම්වලට එළඹීමට රෝගීන්ට ඇති හැකියාව

18. ගිවිසුම්වලට එළඹීමට හෝ නීත්‍යානුකුල ලියකියවිලි ලියා අත්සන් කිරීමට හැකියාවක් රෝගියාට ඇති බව උපදේශක මනෝචිකිත්-සකවරයකු තීරණය කළහොත්, තම ආයතනයේ ආරක්ෂාව යටතේ සිටින එක් එක් රෝගියා පමණක් ගිවිසුම්වලට එළඹෙන බව හෝ නීත්‍යානුකුල ලේඛන ලියා අත්සන් කරන බවට වගබලා ගැනීමේ යුතුකමක් , මානසික සෞඛ්‍ය පහසුකම් ආයතනයකට තිබිය යුත්තේ ය.

මුදා හැරීමේ වාර්තා සහ යොමු කිරීම්

19. මානසික සෞඛ්‍ය සේවයේ ප්‍රයෝජනය ලබන්නෙකු මානසික සෞඛ්‍ය සේවය සඳහා ඇතුළත් කරන ලද සෞඛ්‍ය ආයතනයකින් මුදා හරිනු ලැබූ කවරවූ හෝ අවස්ථාවක, ඊට වගකිවයුතු වෛද්‍ය නිලධාරියා විසින්, මෙහි පහත නියම කර ඇති ආකාරයට නියමිත

ආකෘතියෙහි මුදාහැර්මේ වාර්තාවක් සකස් කළයුතු අතර, පසු විපරම් සත්කාරය සඳහා අවශ්‍ය යොමු කිරීම් කළ යුතුය.

| | | |
|---|---|---|
| යොමු කිරීම් | 20. | මුදා හරිනු ලැබූ විට මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානය විසින් නියමිත නියෝගවල අනුකූලව පසු විපරම් ආරක්ෂාව සඳහා යොමු කිරීම් කළයුතුය. |
| තුවාල හෝ මරණය අනිවාර්යයෙන් වාර්තා කිරීම | 21. | නියමිත නියෝගවලට අනුකූලව පහසුකම් ස්ථානයෙහි නේවාසික රෝගියකු හෝ බාහිර රෝගියකු ලෙස ප්‍රතිකාර ලබන මානසික සෞඛ්‍ය සේවයේ ප්‍රයෝජනය ලබන්නෙකුට සිදුවූ බරපතල තුවාල හෝ මරණය ගැන මානසික සෞඛ්‍ය ඒකක සහ වාට්ටු හෝ වෙනත් ප්‍රතිකාර පහසුකම් ස්ථාන විසින් වාර්තා කළයුතුය. |
| අයිතිවාසිකම් පිළිබඳ පූර්ණ දැනුම | 22. | හැම සෞඛ්‍ය ආරක්ෂාව සලස්වන්නෙකුම හෝ සෞඛ්‍ය ආයතනයක්ම, සේවාවන් පර්පාලනය කිරීමට පූර්වයෙන් සහ පර්පාලනය කෙරෙන අතරතුර, භාවිතා කරන්නන්ට ඇති අයිතිවාසිකම්, සුදුසු ආකාරයකට මානව සෞඛ්‍ය සේවය භාවිතා කරන්නාට දැනුම් දිය යුතුය. |

## III වන කොටස - අවශ්‍ය මානසික සෞඛ්‍ය සේවා සහ පහසුකම්

| | | |
|---|---|---|
| ප්‍රවර්ධනය, වැළැක්වීම සහ ප්‍රජා සේවා | 23. | දිවයින පුරාම මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සහ මානසික රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යාංශය සලකන වැඩ සටහන් සහ සේවාවන් සකස් කිරීම සහ නිතිපතා සමාලෝචනය කිරීම පිණිස, අමාත්‍යාංශය, වෙනත් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු, ආයතන, රාජ්‍ය නොවන සහ පෞද්ගලික සංවිධාන සමග සමීප සම්බන්ධතාවයන් යුතුව කටයුතු කරනු ඇත. |
| අවශ්‍ය පහසුකම් | 24. | ශ්‍රී ලංකාවේ ජාතික මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තියට සහ නියමිත නියෝගවලට අනුව, මානව සෞඛ්‍ය පහසුකම් පුළුල් පරාසයක් අමාත්‍යාංශය විසින් සැලැස්විය යුතුය. |
| යොමු කිරීම් පද්ධතිය | 25. | බාහිර රෝගී සහ ප්‍රජා මානසික සෞඛ්‍ය සේවාවන් සඳහා යොමු කිරීම් පද්ධතියක්, අමාත්‍යාංශය විසින් පිහිටු විය යුතුය. |

කාර්ය මණ්ඩලය සැපයීම සහ වෘත්තීය ප්‍රමිති

26. අවශ්‍ය සේවාවන් සහ පහසුකම් සඳහා වූ කාර්ය මණ්ඩලය අමාත්‍යාංශය විසින් ලබාදිය යුතුය.

27. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම මානසික සෞඛ්‍ය සේවකයන් සහ වෙනත් සෞඛ්‍ය සේවකයන් සඳහා මානසික සෞඛ්‍යයට සම්බන්ධ ප්‍රශ්න ගැන අවශ්‍යයයි, අමාත්‍යාංශය සලකන වෘත්තීය සුදුසුකම් සහ පුහුණුවීමේ අවශ්‍යතාවන්, අමාත්‍යාංශය විසින් නියම කළයුතුය.

මූලික සත්කාරකයන් සඳහා සේවා සහ වැඩ සටහන්

28. ගෙදර පසුබිම් කරගෙන ලැබුණු මානසික සෞඛ්‍ය සේවාවන් උනන්දු කරවීම සහ වැඩි දියුණු කිරම සඳහා, අමාත්‍යාංශය විසින්, මූලික සත්තාරකයන් සඳහා පුහුණු වැඩ සටහන් සහ ආධාරක යාන්ත්‍රණ සකස් කළ යුතුය.

29. අමාත්‍යාංශය විසින් තම තීරණ සහ මානසික සෞඛ්‍ය වැඩ සටහන් සකස් කිරීම, පර්වය පදනම් කරගත් සාක්ෂි සහ පර්යේෂණ මත පාදක කරගත යුතුය.

පර්යේෂණ, නිරීක්ෂණ සහ අගැයීම

30. වැළැක්වීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන්වල ඵලදායීතාවය නිශ්චය කිරීම පිණිස අමාතශ්‍යාංශය විසින් නිතිපතාම එම වැඩ සටහන් නිරීක්ෂණය කිරීම සහ අගැයීමද, අමාත්‍යාංශය විසින් කළ යුතුය.

## <u>IV වන කොටස : ඉච්ඡානුගව ඇතුල්වීම</u>

ඉච්ඡානුග ඇතුළත් කිරීම.

31(1) මානසික අසනීපයකට ප්‍රතිකාර ලබාගැනීම සඳහා ඉදිරිපත් වීමට කැමති කවරවූ හෝ තැනැත්තකු, ඉච්ඡානුග රෝගියකු වශයෙන් කිසියම් ආණ්ඩුවේ හෝ පෞද්ගලික සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් ආයතනයකට ඇතුළත් කරගනු ලැබිය හැකිය.

(2) වයස අවුරුදු දහ අටට (18) අඩු යම් තැනැත්තෙකු ඔහුගේ හෝ ඇයගේ මව්පියන්ගේ හෝ භාරකරුගේ ඉල්ලීම මත ඉච්ඡානුග රෝගියකු වශයෙන් ඇතුළත් කරගනු ලැබිය හැකිය.

(3) වයස අවුරුදු දහතුනකට (13) අඩු ළමයින් , ළමා වාට්ටුවලට

ඇතුළත් කරගනු ලැබිය යුතුය. වයස අවුරුදු දහතුන (13) සහ අවුරුදු දහඅට (18) අතරේ නව යෞවනයන්, නව යෞවනයන්ගේ වාට්ටුවලට ඇතුළත් කරගනු ලැබිය යුතුය.

ඉච්ඡානුග රෝගියකු නිදහස් කිරීම.

32. (1) තමන් කවරවූ හෝ වේලාවක, ඇතැම් විට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට කලින් වුවද, මුදාහරින ලෙස ඉල්ලීමක් කිරීමට ඉච්ඡානුග රෝගියකුට හැකිවේ.

(2) අදාළ තැනැත්තාගේ මානසික තත්ත්වය අනුව සලකන විට ඔහු/ඇය ඉච්ඡානුගව රෝගියකු ලෙස එම පහසුකමයෙහි තවදුරටත් රැඳී සිටීම අනවශ්‍ය බව, එම සෞඛ්‍ය සත්කාරක පහසුකම් ස්ථානය භාර වෛද්‍ය නිලධාරියාගේ මතය වන අවස්ථාවකදී එම නිලධාරියා විසින් අදාළ ඉච්ඡානුග රෝගියා මුදාහරිනු ලැබිය හැකිය.

(3) ඉච්ඡානුග රෝගීහු නියමිත නියෝගවලට අනුව මුදාහැරිය යුතු වෙති.

## <u>V වන කොටස : අනිච්ඡානුග සහ හදිසි ඇතුළත් කිරීම්</u>

අනිච්ඡානුග සහ හදිසි ඇතුළත් කිරීම.

33. (1) අනිච්ඡානුග හෝ හදිසි ඇතුළත් කිරීමක් සඳහා වූ ඉල්ලීමක් මනෝ චිකිත්සක ඒකකයේ ලෙඩුන් භාර ගන්නා වෛද්‍ය නිලධාරියා වෙත, මෙම වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුව ඉදිරිපත් කළයුතුය.

(2) එබඳු ඉල්ලීමක් -

(අ) උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව විය යුතුය ;

(ආ) අනිච්ඡානුග ඇතුළත් කිරීමක් ඉල්ලා සිටීමට හේතු දක්වා පහත සඳහන් අයගෙන් කවරවූ හෝ දෙදෙනෙකු අත්සන් කළ

ප්‍රකාශයකින් යුක්ත විය යුතුය.

(i) වෛද්‍ය වෘත්තියකයකු ;

(ii) මානසික අසනීපය ඇති තැනැත්තාගේ ලඟම නෑයා හෝ භාරකරු ;

(iii) මානසික සෞඛ්‍ය සේවකයකු ; හෝ

(iv) පොලිස් නිලධාරියකු

(3) හැම ඉල්ලීමක්ම, (ලෙඩුන්) ඇතුළත් කර ගන්නා වෛද්‍ය නිලධාරියා විසින්, නියමිත ආකෘතියේ ලියන ලද ලිඛිත ප්‍රකාශයකින් තහවුරු කරනු ලැබිය යුතු අතර එම ප්‍රකාශයේ පහත දක්වා ඇති කරුණු ඇතුළත් විය යුතුය.

(අ) ඔහුගේ හෝ ඇයගේ මතය අනුව, අදාළ තැනැත්තා මානසික අසනීපයකින් පෙළෙන බව.

(ආ) ඔහු විසින් පරීක්ෂා කිරීමේදී දක්නට ලැබුණු සලකුණු සහ මානසික රෝග ලක්ෂණ ; සහ

(ඇ) (i) අදාළ තැනැත්තාගේ ජීවිතය බේරාගැනීම ;

(ii) ඔහුගේ හෝ ඇයගේ තත්ත්වය බරපතල ලෙස පිරිහීම වැළැක්වීම ;

(iii) රෝගියා බරපතල ලෙස දුක් විඳීමෙන් සහනය සැලැස්වීම ;

(iv) ඇයගේ හෝ ඔහුගේ මානසික අසනීපයේ ප්‍රතිඵලයක් ලෙස, රෝගියා ප්‍රචණ්ඩ ලෙස හැසිරීමෙන් සහ ඔහුටම හෝ වෙනත් අයට අන්තරායක්වීමෙන් රෝගියා වැළැක්වීම

සඳහා, පරීක්ෂා පිණිස මනෝචිකිත්සක පහසුකම් සහිත රෝහලකට අනිච්ඡානුග ඇතුළත් කිරීමක් අවශ්‍යයයි ඔහු/ඇය සලකන්නේ ඇයිද යන බවට හේතු

(4) ඉන්පසුව, දෙවන වෛද්‍ය නිලධාරියකු හෝ උපදේශක මනෝචිකිත්සකයකු විසින්, ඉල්ලුම්පත්‍රය සමාලෝචනය කොට එය අනුමත කළ යුතුය, නැතහොත් ප්‍රතික්ෂේප කළ යුතුය. ඉල්ලීම අනුමත කරනු ලැබූ විට, (ලෙඩුන්) ඇතුළත් ගන්නා වෛද්‍ය නිලධාරියා විසින් එම තැනැත්තා එම ආරෝග්‍යශාලාවට, උපරිම වශයෙන් පැය හතලිස් අටක (48) කාලයකට ඇතුළත් කළ යුතුය.

34. මෙම කොටස යටතේ අනිච්ඡානුග හෝ හදිසි ඇතුල් කිරීම් අනුමත කිරීමකට විරුද්ධව, 75 වන වගන්තියේ සහ ඊට සම්බන්ධ නියෝග

වල නිශ්චිතව දක්වා ඇති පරිදි, වගකිවයුතු දිස්ත්‍රික්ක සමාලෝචන කමිටුව වෙත, අනුමතිය ප්‍රදානය කරන ලද දිනයේ සිට දින පහළොවක් (15) කාල පරිච්ඡේදයක් තුළ අභියාචනයක් ගොනු කිරීමේ අයිතිවාසිකම, රෝගියාට හෝ ඔහුගේ/ ඇයගේ ළඟම නෑයාට හෝ භාරකාරයාට තිබිය යුත්තේ ය. අනුමත කිරීම, රෝහල් අධ්‍යක්ෂ විසින් සමාලෝචනය කළයුතු අතර, අභියාචනය ගොනු කිරීමෙන් දවස් තුනක් ඇතුළත එම අනුමත කිරීම ලිඛිතව තහවුරු කළයුතුය. නැතහොත් රෝගියා මුදාහරින ලෙස නියෝග කළ යුතුය.

35. රෝහල් අධ්‍යක්ෂගේ තීරණ සම්බන්ධයෙන් රෝහල් අධ්‍යක්ෂ විසින්, අනුමත කිරීම තහවුරු කළ දිනයේ සිට දවස් පහළොවක (15) කාල පරිච්ඡේදයක් ඇතුළත, වගකිව යුතු දිස්ත්‍රික්ක සමාලෝචන කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිවේ.

(1) දිස්ත්‍රික් සමාලෝචන කමිටුවේ තීරණය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සමාලෝචන කමිටුවේ තීරණය නිකුත් කිරීමෙන් දවස් පහළොවක් (15) ඇතුළත දුක්ගැනවිල කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(2) අභියාචනය ගොනු කිරීමෙන් දවස් පහළොවක් (15) ඇතුළත, අභියාචනය සම්බන්ධයෙන් දුක්ගැනවිලි කමිටුව විසින් තීරණයක් නිකුත් කළ යුතුය.

(3) දුක්ගැනවිලි කමිටුවේ තීරණය සම්බන්ධයෙන්, දුක් ගැනවිලි කමිටුවල තීරණය නිකුත් කොට දවස් පහළොවක් (15) ඇතුළත, ඕනෑම දිසා අධිකරණයකට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි විය යුතුය.

නීතිඥයකු පත් කිරීම.

36. රෝගියකුට පෞද්ගලික නියෝජිතයකු අවශ්‍ය වන්නේ ද යන බව දිස්ත්‍රික් සමාලෝචන කමිටුව විසින් තීරණය කරන ලෙසත්, නියමිත නියෝගවලට අනුව එබඳු නියෝජිතයකු පත් කරන ලෙසත්, (රෝගියා) ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී, මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානය විසින් ඉල්ලා සිටිය යුතුය.

අනිච්ඡානුග රෝගීන් පිළිගත යුත්තේ බලපත්‍රයක් ඇත්නම් පමණකි.

37. ආණ්ඩුවේ පහසුකම් ස්ථාන , රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික රෝහල් සහ සාත්තු නිවාස, විසින් අනිච්ඡානුග

රෝගීන් ඇතුළත් කරගත යුත්තේ, මෙම පනත යටතේ වලංගු බලපත්‍රයක් තිබේ නම් සහ නියමිත නියෝග යටතේ පමණකි.

38. (1) පොලිස් ස්ථානයට අදාළ ප්‍රදේශය තුළ සිටින යම් තැනැත්තෙකුගේ හැසිරීම හේතුකොටගෙන, එම තැනැත්තා ඔහුටත් හෝ සමාජයටත් අනතුරුදායක වන්නේ නම්, එම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ, පොලිස් ස්ථානාධිපතිවරයා විසින් එම තැනැත්තා ළඟම පිහිටි වෛද්‍ය පහසුකම් ස්ථානය වෙත සෘජුවම ගෙනයා යුතුය. සෙසු සියළුම ක්‍රියාමාර්ග අවසන් වී ඇති අවස්ථාවලදී මිස යම් තැනැත්තෙකුගේ අනතුරුදායක විය හැකි එහෙත් අපරාධකාරී නොවන හැසිරීම හේතුවෙන් ඔහු පොලිස් අත්අඩංගුවට නොගත යුතුය.

(2) (1) වෙන උපවගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලැබූ කිසිම තැනැත්තෙකු , ඔහු හෝ ඇය අත්අඩංගුවට ගැනීමට ඇති හේතු හැකි තරම් ඉක්මණින් දැනුම් දීමෙන් තොරව අත්අඩංගුවේ රඳවා තබා නොගත යුතුය. ඊට අමතරව, එම තැනැත්තා පොලිස් අත්අඩංගුවේ සිටින බව, එම තැනැත්තාගේ ළඟම නෑයා හෝ භාරකරු හෝ ප්‍රජා මානසික සෞඛ්‍ය සේවකයකු වෙත දැනුම් දිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලැබූ හැම තැනැත්තෙකුම, පැය තුනක් (3) ඇතුළත ආසන්නතම ආරෝග්‍ය ශාලාව වෙත රැගෙන යායුතුය.

(4) එම තැනැත්තා, 33 වන වගන්තියේ නියම කර ඇති කාර්ය පටිපාටිවලට අනුව ආසන්නතම මනෝචිකිත්සක ඒකකයට ඇතුළත් කරනු ලැබිය යුතුය.

(5) වෛද්‍ය වෘත්තිකයකු, මානසික අසනීපයක් ඇති තැනැත්තෙකුගේ ලඟම නෑයකු හෝ මනෝ චිකිත්සක සමාජ සේවකයකු විසින්, ඔහු හෝ ඇය එසේ සිතයි නම්, එම තැනැත්තා ලඟම පිහිටි රජයේ රෝහල හෝ පෞද්ගලික රෝහල වෙත, නිරීක්ෂණය අරභයා ඇතුල් කිරීම පිණිස හෝ මානසික සෞඛ්‍ය ස්ථානයක් වෙත මාරු කිරීම පිණිස සහාය ලබාදෙන ලෙස, රෝගියා පදිංචිව සිටින ප්‍රදේශයේම

පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරියා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එබඳු සහාය ලබාදීම, පොලිස් ස්ථානය භාරව සිටින නිලධාරියාගේ යුතුකම විය යුත්තේය.

## V1 වන කොටස : රඳවා තබාගැනීම සහ අනිච්ඡානුග හා හදිසි ප්‍රතිකාර

39. v වන වගන්තිය යටතේ, අනිච්ඡානුගව හෝ හදිසි පදනමක් මත ඇතුළත් කරගනු ලැබූ රෝගියකු, ආරම්භක පැය හතලිස්අටක් (48) වන රඳවා තැබීමේ කාලපරිච්ඡේදය අවසන්වීමට කලින්,

(1) තැනැත්තාගේ ජීවිතය බේරා ගැනීම ;

(2) ඔහුගේ හෝ ඇයගේ තත්ත්වය බරපතල ලෙස පිරිහීයාම වැළැක්වීම.

(3) රෝගියා තදබල ලෙස දුක් ගැහැට විඳීම වැළැක්වීම ; හෝ

(4) ඔහුගේ හෝ ඇයගේ මානසික අසනීපයේ ප්‍රතිඵලයක් ලෙස රෝගියා ප්‍රචණ්ඩ හැසිරීමක හෝ ඔහුටම හෝ අන් අයට අන්තරායක්වීම වැළැක්වීම

සඳහා තවදුරටත් රඳවා තබාගැනීම අවශ්‍ය යයි දක්වමින් උපදේශක මනෝචිකිත්සකවරයෙකු සහ වෛද්‍ය නිලධාරියකු යන දෙදෙනෙකු තීරණය කොට නියමිත ආකෘතිපත්‍රයේ ලිඛිත නිර්දේශයක් කළහොත් එම රෝගියා දවස් තිහකට (30) නොවැඩි කාලයක් තවදුරටත් රඳවා තබා ගනු ලැබිය හැකිය.

මාස තුනක කාලයක් රඳවා තබාගැනීම.

40. (1) තැනැත්තාගේ ජීවිතය බේරා ගැනීම,

(2) ඔහුගේ හෝ ඇයගේ තත්ත්වය බරපතල ලෙස පිරිහීයාම වැළැක්වීම.

(3) රෝගියා තදබල ලෙස දුක් ගැහැට විඳීම වැළැක්වීම.

(4) ඔහුගේ හෝ ඇයගේ මානසික රෝගයේ ප්‍රතිඵලයක් ලෙස රෝගියා ප්‍රචණ්ඩ හැසිරීමක හෝ අන්අයට අන්තරායක්වීම වැළැක්වීම.

සඳහා රෝගියා තවදුරටත් රඳවා තබාගැනීම අවශ්‍ය වන බවට, උපදේශක මනෝ චිකිත්සකවරයකු හෝ තවත් වෛද්‍ය වෘත්තියකයකු විසින් නියමිත ආකෘතියෙහි ලියන ලද ලිඛිත නිර්දේශයක බලය පිට, මාස තුනකට නොවැඩි කාලයක් තවදුරටත් රඳවා තබාගනු ලැබිය හැකිය.

41. (1) මාස හයක් දක්වා වූ තවදුර කාල පර්විජේදයක් රඳවා තබා ගැනීම සහ ප්‍රතිකාර කිරීම කරනු ලැබිය යුත්තේ, ස්වාධීන උපදේශක මනෝ විකිත්සකවරයකු සහ තවත් වෛද්‍ය වෘත්තිකයකු විසින් කරනු ලබන නිර්දේශයක් මතය. එබඳු නිර්දේශයක් ඉල්ලා සිටිය යුත්තේ, මානසික සෞඛ්‍ය උපදේශක සභාවේ උපදෙස් මත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කරන ලද කාර්යපාටියට අනුවය.

මාස හයක් ප්‍රතිකාර සඳහා ඇතුලත් කර ගැනීම පිළිබඳ ඉල්ලුම් පත්‍රය.

(2) උපදේශක මනෝවිකිත්සකගේ නිර්දේශයෙහි -

(අ) දිගටම රඳවා තබාගැනීම අවශ්‍යවීමට හේතු ; සහ

(ආ) එසේ රඳවා තබාගැනීමට තිබිය යුතු නිසි පහසුකම් වල ආකාරය ,

නිශ්චිතව සඳහන් විය යුතුය.

42. (1) යම් රෝගියකුට, ප්‍රතිකාර පිළිබඳ තීරණය ගැනීමට නොහැකි බව උපදේශක විකිත්සකවරයා තීරණය කළහොත් , එවිට ( විද්යුත් ආක්ෂේප විකිත්සාව ඇතුළු) ප්‍රතිකාර අනිච්ජානුගව ලබාදිය හැක්කේ, රෝගියා සම්බන්ධයෙන් කරනු ලබන ස්වාධීන පරීක්ෂණ පදනම් කරගෙන ප්‍රතිකාරවල අවශ්‍යතාවය ගැන, උපදේශක මනෝවිකිත්සකවරයා සහ තවත් වෛද්‍ය වෘත්තිකයකු (ඔහුද උපදේශක මනෝවිකිත්සකවරයකු වන්නේ නම් වඩා හොඳය ) යන දෙදෙනාම, එකඟවන්නේ නම් පමණකි.

අනිච්ජානුග සහ අඛණ්ඩ ප්‍රතිකාර

(2) මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජන ලබන්නෙකු නිදහස් කරනු ලැබූ විට, ඔහු, අවශ්‍යයයි, ව ගකිවයුතු වෛද්‍ය වෘත්තිකයා සහ අධීක්ෂක වෛද්‍ය නිලධාරියා විසින් සලකනු ලැබුවහොත් ප්‍රජා ප්‍රතිකාර නියෝගයකට අනුව, ප්‍රජාව තුළ අඛණ්ඩ සත්කාරය යටතේ සිටිය යුතුය. අඛණ්ඩ සත්කාර නියෝග, නියමිත රෙගුලාසි මාලාවට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතුය. මානසික සෞඛ්‍ය සේවාවල ප්‍රයෝජන ලබන්නා අඛණ්ඩ සත්කාරය ප්‍රතික්ෂේප කළහොත්, ඔහු හෝ ඇය මෙම පනතට අනුව, පළමුවෙන්ම මනෝ විකිත්සකට

වාට්ටුවකට ඇතුළත් කරනු ලැබුවහොත්, ඔහුට හෝ ඇයට ලැබිය හැක්කේ අනිච්ජානුග ප්‍රතිකාර පමණකි.

(3) රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික පසුබිමකදී, විද්‍යුත් ආපේක්ෂ චිකිත්සාව ( Electro Convulsive Therapy) ලබාදෙනු ලබන්නේ, ඉතා මෑත සාක්ෂි මත පදනම්වූ පර්වය සහ අමාත්‍යංශයේ මාර්ගෝපදේශ අනුව වන අතර, ඒ සඳහා රෝගියා පිළිබඳව කරන ලද ස්වාධීන පරීක්ෂණයක් මත පදනම්වූ උපදේශක මනෝ චිකිත්සකවරයකුගෙන් නියමිත ආකෘතිපත්‍රය අනුව ලිඛිත අනුමතිය සහ ප්‍රතිග්‍රාහකගේ කැමැත්ත හෝ දෙවන වෛද්‍යවරයකුගේ ( ඔහු වෙනත් උපදේශක මනෝ චිකිත්සකුගේ නම් වඩාත් හොඳය) අනුමතිය අවශ්‍යවේ.

(4) අනිච්ජානුග ප්‍රතිකාර සහ විද්‍යුත් ආපේක්ෂ චිකිත්සාව සඳහා අනුමතිය නියමිත ආකෘතිපත්‍රයේ ලියා තිබිය යුතුය.

(5) නේවාසික රෝගී සහ ප්‍රජා සත්කාරය යන දෙයාකාරයම සඳහා,

(අ) ප්‍රයෝජන ලබන්නාගේ මරණය, ඔහුට අප්‍රතිවර්තීය හානියක් සිදුවීම හෝ භාවිතා කරන්නාගේ සෞඛ්‍යය බරපතල ලෙස පරිහානියට පත්වීම.

(ආ) භාවිතා කරන්කුට සිදුවන බරපතල දුක්ගැහැට.

(ඇ) භාවිතා කරන්නා, තමාටම නොවෙතත් තැනැත්තන්ට බරපතල පීඩා සිදු කිරීම ; හෝ

(ඈ) භාවිතා කරන්නා විසින් ඔහුට හෝ වෙනත් අයට අයත් දේපළවලට හානි පැමිණවීම හෝ එම දේපලවලට අලාභ සිදු කිරීම.

43. දැනුම් දීමෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමේ හැකියාව යම් රෝගියකුට නොමැති වුවහොත්,

හදිසි ප්‍රතිකාර

(1) රෝගියාගේ ජීවිතය බේරා ගැනීමට හදිසියේම අවශ්‍ය වන්නාවූ ; හෝ

(2) ඔහුගේ හෝ ඇයගේ තත්ත්වය බරපතල ලෙස පිරිහීම

වැළැක්වීම පිණිස හදිසියේ කිරීම අවශ්‍යවන්නාවූ (වෙනස් කළ නොහැකි නොවන ) ; හෝ

(3) රෝගියා විසින් බරපතල ලෙස දුක් විඳීම අඩුකිරීම සඳහා කළයුතු ( වෙනස් කළ නොහැකි හෝ උපද්‍රවයක් නොවන්නාවූ)

(4) ප්‍රචණ්ඩ ලෙස හැසිරීමෙන් හෝ තමාටම හෝ වෙනත් අයට අන්තරායක්වීමෙන් රෝගියා වැළැක්වීමට වහාම අවශ්‍ය වන සහ අවම මැදිහත්වීම වන්නාවූ ( වෙනස් කළ නොහැකි හෝ උපද්‍රවයක් නොවන්නාවූ ; හෝ

කවර ප්‍රතිකාරයකට වුවද, 45 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(5) ඉහත සඳහන් කවරවූ හෝ කොන්දේසි අදාළ වන්නාවූ අවස්ථාවකදී හදිසි ප්‍රතිකාර ලබාදිය හැක්කේ, උපදේශක මනෝචිකිත්සකවරයකු එය අවශ්‍ය වන බවට එකඟ වන්නේ නම් පමණකි. ප්‍රජාව තුළ හදිසි ප්‍රතිකාර ලබාදිය හැකි වන්නේ එම ප්‍රතිකාර, රෝගියාගේ වර්තමාන ප්‍රතිකාර විධියට අනුකූල වන්නේ නම් හෝ, රෝගියා ප්‍රතිකාර ලබන්නේ යම් මනෝ චිකිත්සකවරයකුගේ වගකීම යටතේ ද, එම මනෝචිකිත්සකවරයා සමග පෞද්ගලිකව හෝ දුරකථනය මගින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව පමණකි.

(6) මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රතිකාර වෙනස් කළ නොහැකි වන්නේ, ඒ මගින් අහිතකර වෙනස් කළ නොහැකි ශාරීරික හෝ මානසික ප්‍රතිඵල ඇත්තේ නම් සහ, උපද්‍රව සහගත වන්නේ , වැදගත් ශාරීරික උපද්‍රව ඇති වන්නේ, විද්‍යුත් ආපේක්ෂ චිකිත්සාව ඇතුළත් වන්නේ නම් පමණකි.

44. අනිච්ජානුග රෝගීන් වෙන්කර රඳවා තැබිය හැක්කේ, නියමිත නියෝගවලට අනුව පමණකි.

වෙන්කර තැබීම

45. යම් රඳවා තබාගැනීමේ නියෝගයක් හෝ අනිච්ජානුග ප්‍රතිකාර කිරීමට අවසරදීමක් නිකුත් කිරීමෙන් පැය විසිහතරක් (24) තුළ, රෝගියාට සහ ඔහුගේ හෝ ඇයගේ ළඟම නෑයාට හෝ භාරකරුට ලිඛිත නිවේදනයක් ලැබිය යුතුය.

රෝගියාට, ඔහුගේ හෝ ඇයගේ ළඟම නෑයාට හෝ භාරකරුට දැනුම්දීම.

46. මෙම කොටස යටතේ වූ රඳවා තබාගැනීමේ හෝ ප්‍රතිකාර කිරීමේ නියෝගයකට විරුද්ධව, 76 වන වගන්තියේ සහ ඊට සම්බන්ධ

රෙගුලාසිවල නියම කර ඇති පරිදි අනිච්ඡානුග රඳවා තබාගැනීම හෝ ප්‍රතිකාර නියෝග කරන ලද දිනයේ සිට දවස් පහළොව(15)ක කාලපරිච්ඡේදයක් තුළ රෝහල් අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම රෝගියාට, ඔහුගේ හෝ ඇයගේ ලඟම නෑයාට හෝ භාරකරුට තිබිය යුත්තේය.

රඳවා තබාගැනීම සහ අනිච්ඡානුග ප්‍රතිකාර සඳහා අභියාචනය.

රෝහල් අධ්‍යක්ෂගේ තීරණය, අභියාචනය ගොනු කිරීමෙන් දවස් පහක් (5)ක් ඇතුළත ලිඛිතව නිකුත් කළ යුතුය. මෙම තීරණයට විරුද්ධව, මානසික සෞඛ්‍ය පහසුකම පිහිටා ඇති දිස්ත්‍රික්කය සඳහා වූ වගකිවයුතු දිස්ත්‍රික් සමාලෝචන කමිටුව වෙත අභියාචනා කළ හැකිය. අභියාචනය ගොනු කිරීමෙන් දවස් පහළොවක් (15) තුළ දිස්ත්‍රික් සමාලෝචන කමිටුව විසින්, ලිඛිත තීරණයක් කළ යුතුය.

දිස්ත්‍රික් සමාලෝචන කමිටුවේ තීරණයක් සම්බන්ධ අභියාචනයක් දුක් ගැනවිලි කමිටුව වෙත ඉදිරිපත් කළ යුත්තේ දුක් ගැනවිලි කමිටුවේ අභිමතය පරිදිය.

## VII වන කොටස - අලුත් කිරීමේ සහ නිදහස් කිරීමේ කාර්ය පටිපාටිය

47. (1) 37 වන වගන්තියේ සඳහන් කර ඇති රඳවා තබාගැනීම සහ ප්‍රතිකාර , පළමු අවස්ථාවේදී පළමුවන මාස හයක කාල පරිච්ඡේදයෙන් පසුව, මාස හයක් දක්වා වූ තවත් කාල පරිච්ඡේදයක් සහ ඉන් අනතුරුව එක් වරකට මාස දොළහක් බැගින් අලුත් කරනු ලැබිය හැකිය.

(2) එබඳු අලුත් කිරීම් සම්බන්ධයෙන්, එම අලුත් කිරීම අනුමත කරන ලද දිනයේ සිට දවස් පහළොවක (15) කාල පරිච්ඡේදයක් තුළ රෝහල් අධ්‍යක්ෂ වෙත අභියාචනා කරනු ලැබිය හැකි විය යුතුය. අභියාචනය ගොනු කිරීමෙන් දවස් පහක් (5) ඇතුළත රෝහල් අධ්‍යක්ෂ විසින් ලිඛිත තීරණයක් නිකුත් කළ යුතුය.

48. තත්කාලීනව මෙම පනත යටතේ මානසික සෞඛ්‍ය රෝහල් ඒකකයක හෝ වාට්ටුවක රඳවා තැබීමට නියමිතවූද, සැක කරන ලද හෝ වරදකරු කරන ලද

ආරෝග්‍ය ශාලාවෙන් බැහැරව සිටීමේ අවසරය.

සාපරාධී වරදකරුවකු නොවන යම් රෝගියකුට, නියමිත නියෝගවලට අනුව මනෝ චිකිත්සක ඒකකයෙන් බැහැරව සිටීම සඳහා නිවාඩු ලබාදීමට උපදේශක මනෝ චිකිත්සකවරයාට හැකිවේ.

නිවාඩු නොමැතිව පැමිණ නොසිටින රෝගීන් ආපසු පැමිණීම සහ නැවත ඇතුළත් කර ගැනීම.

49. (1) තත්කාලීනව, මෙම පනතේ ඉහත සඳහන් විධිවිධාන යටතේ මනෝ චිකිත්සක ඒකකයේ රඳවා තබාගැනීමට යටත් වන රෝගියකු,

(අ) මෙම පනතේ විධිවිධාන යටතේ දෙන ලද නිවාඩු නොමැතිව මනෝ චිකිත්සක ඒකකයෙන් බැහැරව සිටින ; හෝ

(ආ) යම් අවස්ථාවක හෝ මෙම පනත යටතේ තමන්ට දෙන ලද කිසියම් නිවාඩු කාලයක් අවසන්වූ විට හෝ එය යටතේ ආපසු කැඳවන ලද විට හෝ මනෝ චිකිත්සක ඒකකයට ආපසු පැමිණීමට අපොහොසත් වන ; හෝ

(ඇ) මෙම පනත යටතේ නිවාඩු ලබාදීමේදී, පනවන ලද කොන්දේසිවලට අනුව ඔහු හෝ ඇය පදිංචිව සිටිය යුතු යයි නියමිත යම් ස්ථානයකින්, අවසරයකින් තොරව, බැහැරව සිටින

අවස්ථාවකදී, ඔහු, මෙම පනතේ විධිවිධානවලට යටත්ව යම් පොලිස් නිලධාරියකු, ප්‍රජා මානසික සෞඛ්‍ය රෝහල් ඒකකය හෝ වාට්ටුව භාරව සිටින වෛද්‍ය නිලධාරියා හෝ විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් හෝ, අත් අඩංගුවට ගෙන රෝහලට හෝ ඔහු හෝ ඇය පදිංචිව සිටිය යුතු යයි නියමිත වෙනත් ස්ථානයකට ආපසු භාරදෙනු ලැබිය හැකිය.

අනිච්ඡානුග තත්ත්වයේ සිට ඉච්ඡානුග තත්ත්වයට රෝගියා වෙනස්වීම.

50. අනිච්ඡානුගව රඳවා තබාගන්නා ලද කාලය තුළ යම් අවස්ථාවක, අනිච්ඡානුග රඳවා ගැනීම අවශ්‍යවීමට හේතුවූ තත්ත්වය වෙනස් වුවහොත්, හෝ රඳවා තබා ගනු ලබන කාලය තුළ යම් අවස්ථාවක, ඉච්ඡානුග රෝගියකු ලෙස රෝහලේ රැඳී සිටින බවට රෝගියා පූර්ණ කැමැත්ත ප්‍රකාශ කළහොත් හෝ, උපදේශක මනෝ චිකිත්සක විසින් අදාළ තැනැත්තා, ඔහුගේ හෝ ඇයගේ රඳවා තැබීමෙන් මුදාහරිනු ලබනු ඇත, නැතහොත්, ඉච්ඡානුග රෝගියකු වශයෙන් ඔහුගේ හෝ ඇයගේ තත්ත්වය ලිඛිතව තහවුරු කරනු ඇත.

රඳවා තබාගත් රෝගියෙකු නිදහස් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය.

51. (1) මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානයක රඳවා තබනු ලැබීමට යටත් රෝගියකු නිදහස් කිරීම සඳහා වූ කෙරෙන ලිඛිත ඉල්ලීමක් රෝගියාගේ ලඟම නෑයා හෝ භාරකරු විසින් කරනු ලැබිය හැකිය.

(අ) එබඳු ඉල්ලීමක්, රෝගියා රඳවා තබා ඇති මනෝචිකිත්සක ඒකකයේ පරිපාලනය භාරව සිටින වෛද්‍ය නිලධාරියා වෙත යටත් පිරිසෙයින් පැය හතලිස් අටක (48) ලිඛිත දැනුම්දීමක් කිරීමෙන් පසුව කරනු ලැබිය හැකිය ;

(ආ) රෝගියා, මෙම පනතේ VIII වන හෝ IX වන කොටස යටතේ රඳවා තබාගනු ලැබූ අවස්ථාවකදී, ඔහු හෝ ඇය මෙම පනතේ මෙම වගන්තිය යටතේ රෝහලෙන් නිදහස් කරනු ලැබිය නොහැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ලැබුණු විට, වගකිවයුතු වෛද්‍ය නිලධාරියා විසින්, නිදහස් කිරීමේ නියෝගයක් හෝ එසේ නැතිව, තවදුරටත් රඳවා තබා ගතයුතු වන්නේ නම්, එම නිලධාරියාගේ මතය අනුව, රෝගියා නිදහස් කරනු ලැබුවහොත්,

(අ) ඔහු තමාටම හෝ වෙනත් තැනැත්තන්ට අනතුරු දායක ආකාරයට ක්‍රියා කරනු ඇතැයි , හෝ

අනිච්ඡානුග රෝගීන් පිළිගත යුත්තේ බලපත්‍රයක් ඇත්නම් පමණකි.

(ආ) ඔහුට නිසි ප්‍රතිකාර නොලැබෙනු ඇතැයි යන බව සහතික කෙරෙන වාර්තාවක් නිකුත් කළ යුතුය.

(3) නිදහස් කිරීමේ නියෝගය හෝ වාර්තාව, නිදහස් කරන ලෙස ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් පැය හතලිස් අටක් (48) ඇතුළත, කාර්ය භාර වෛද්‍යවරයාට ලබාදිය යුතුය. ඊට අමතරව, ආඥාවේ හෝ වාර්තාවේ පිටපතක්, රෝගියාට හෝ, නිදහස් කරන ලෙස ඉල්ලන අනෙක් ඉල්ලුම්කරුට ලබාදිය යුතුය.

(4) රෝගියා නිදහස් කරන ලෙස ඉල්ලන තවත් ඉල්ලුම් පත්‍රයක් වාර්තාවේ දිනයෙන් ආරම්භ වන එක් මාසයක් තුළ

ඉදිරිපත් නොකළ යුතුය.

(5) යම් රෝගියකු සම්බන්ධයෙන් මෙම වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ වාර්තාවක් ඉදිරිපත් කරන ලබන කවරවූ හෝ අවස්ථාවක, මනෝ චිකිත්සක ඒකකය භාර වෛද්‍ය නිලධාරියා විසින්, රෝගියාගේ ළඟම නෑයාට දැනගන්නට සැලැස්විය යුතු අතර, එම නෑදෑයා විසින්, ඔහුට හෝ ඇයට එසේ දැනුම් දෙනු ලැබූ දිනයෙන් ආරම්භ වන දවස් තිහක (30) කාල පරිච්ඡේදයක් තුළ, එම රෝගියා රඳවා තබාගැනීම සමාලෝචනය කරන ලෙස හෝ, ආඥාව අලුත් කරන ලෙස හෝ දිස්ත්‍රික් සමාලෝචන කමිටුව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

(6) නිදහස් කරනු ලැබූ රෝගියකු නැවත ඇතුළත් කරගත යුතු බව උපදේශක මනෝ චිකිත්සකවරයකු සහ තවත් වෛද්‍ය නිලධාරියකු, විශේෂයෙන්ම තවත් උපදේශක මනෝ චිකිත්සකයකු ලිඛිතව නිර්දේශ කළහොත් මිස , නිදහස් කිරීමෙන් පැය 72ක් ඇතුළත නැවත ඇතුළත් කර නොගත යුතුය.

නිදහස් කිරීමේ කාර්යපටිපාටිය.

52 (1) රෝහලෙහි අනිච්ඡානුගව රඳවා තබාගැනීම සඳහා හෝ රෝහලෙහි අනිච්ඡානුග ප්‍රතිකාර සඳහා වූ නියෝගයකින් නිදහස් කරනු ලැබූ විට, එසේ නිදහස් කරනු ලැබූ තැනැත්තකුට, රෝහලෙන් නිදහස් කිරීමේ ආඥාව පිළිබඳ ලිඛිත තහවුරුවක් නිදහස් කිරීමෙන් පැය හතලිස් අටක් (48) ඇතුළත ලැබෙනු ඇත.

(2) නිදහස් කරනු ලැබූ විට, අවශ්‍ය විය හැකි පසු විපරම් සත්කාරය සඳහා යම් යොමුවක්, මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානය විසින් ලබා දෙනු ඇත.

(3) නිදහස් කරනු ලැබූ තැනැත්තෙකුට, ඔහුගේ හෝ ඇයගේ නිවසට හෝ වෙනත් පදිංචි ස්ථානයකට ආපසු යෑම සඳහා අවශ්‍ය වත්කමක් නොමැති අවස්ථාවක, එම තැනැත්තා, මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානය විසින් ඔහුගේ හෝ ඇයගේ නිවසට හෝ වෙනත් පදිංචි ස්ථානයකට කැඳවා ගෙන යායුතු අතර, එසේ නැතහොත්, ඔහුගේ හෝ ඇයගේ ගමන් වියදම් සඳහා සාධාරණ මුදලක් ලබාදිය යුතුය.

## VIII වන කොටස : මානසික රෝගී සිරකරුවන්

මානසික රෝගී සිරකරුවන්

53. (1) රටේ බන්ධනාගාරවලින් යටත් පිරිසෙයින් දෙකකවත්, නම් කරනු ලැබූ මානසික සෞඛ්‍ය ඒකක තිබිය යුතුය. එබඳු ඒකකයක්, තදනන්තර නියෝගවල නියම කර ඇති ප්‍රමිතිවලට අනුකූලව අවශ්‍ය වන මානසික සෞඛ්‍ය සේවාවක් ලබාදීම අවශ්‍ය උපකරණ වලින් සමන්විත විය යුතුය.

(2) මානසික රෝගී සිරකරුවකු යම් මනෝ චිකිත්සක ඒකකයකට හෝ වෙනත් පහසුකම් ස්ථානයකට ඇතුළත් කර ගන්නා ලෙස අධිකරණයක් විධාන කළහොත් එබඳු විධානයක් එම තැනැත්තා එම ඒකකයට, වාට්ටුවට හෝ පහසුකම් ස්ථානයකට ඇතුළත් කර ගැනීම පිළිබඳ ප්‍රමාණවත් අධිකාර් බලයක් විය යුතුය.

සිරගෙදර හෝ බන්ධනාගාරයක දණ්ඩන නියමයකට යටත්ව සිටින සිරකරුවන්ට මානසික අසනීපයක් ඇතිවූ විට රෝහලට ගෙන යායුතුය.

54. (1) යම් බන්ධනාගාරයක බන්ධනාගාර ගත කරනු ලැබ සිටින යම් තැනැත්තෙකු, රෝහලකින් බැහැරදී ප්‍රතිකාර කරනු ලැබිය නොහැකි තරමට මානසික රෝගී තත්ත්වයකට පත්වුවහොත්, එම තැනැත්තා, නිරීක්ෂණය සහ ප්‍රතිකාර සඳහා රෝහලකට ඇතුළත් කළයුතු බවට උපදේශක මනෝ චිකිත්සකයකුගේ සහතිකයක් ද සමග එකී සිරගෙය හෝ බන්ධනාගාරය පිහිටියේ යම් දිසා අධිකරණයක අධිකරණ බලය තුළද, එම දිසා අධිකරණය විසින්, අධිකරණ අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළයුතු අතර, එම තැනැත්තා බන්ධනාගාරගත කර තිබිය හැකි වූ දණ්ඩන නියමය අවසන් වන තෙක්, බලපත්‍රයේ නම්කර ඇති රෝහලේ රඳවා තැබීම පිණිස එම රෝහල වෙත ගෙනයන යන ලෙස අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් තමන්ගේ අත්සනින් නිකුත් කරනු ලබන අධිකාර පත්‍රයක් මගින් විධාන කිරීම නීත්‍යානුකූල විය යුත්තේය. තැනැත්තෙකු එම රෝහල වෙත ගෙනයනු ලබන්නේ යම් ස්ථානයක සිටද, එම ස්ථානය භාරව සිටින තැනැත්තා විසින්, එකී තැනැත්තා භාරදෙන අවස්ථාවේදී, එම තැනැත්තා බන්ධනාගාර ගත කරනු ලැබුවේ යම් දණ්ඩන නියමයක් මතද, එම දණ්ඩන නියමයේ පිටපතක් එම

රෝහලේ උපදේශක මනෝ චිකිත්සකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රෝහලේ රඳවාගනු ලැබූ යම් තැනැත්තෙකු තවදුරටත් රෝහලේ සිටීම අවශ්‍ය නොවන බව උපදේශක මනෝ චිකිත්සකගේ මතය වන්නේ නම්, මෙම මතය ලැබුණු විට එම තැනැත්තා රෝහලේ සිට ඔහු හෝ ඇය ගෙනයනු ලැබූ ස්ථානය වන සිරගෙදර, බන්ධනාගාරය හෝ සිරකර තබන ලද වෙනත් ස්ථානයක් වෙත ආපසු ගෙන යන ලෙස විධාන කරමින්, අධිකරණ අමාත්‍යවරයා විසින් අධිකාර පත්‍රයක් නිකුත් කිරීම හෝ ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යවරයා යෝග්‍ය යයි සලකන වෙනත් නියෝග කළ යුත්තේ ය.

(3) මෙම වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ රෝහලේ ගත කරන ලද යම් කාල පරිච්ඡේදයක් තිබේ නම්, එම මුළු කාල පරිච්ඡේදයම බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයේ කොටසක් ලෙස ගණන් ගත යුතුය.

මානසික සෞඛ්‍යය වර්ධනය වීමෙන් පසුව රඳවා තැබීමෙන් නිදහස් කිරීම.

55. 54 වන වගන්තිය යටතේ, රෝහලේ සිටිය යුතු යයි නියෝග කරනු ලැබූ තැනැත්තෙකු, තවදුරටත් රෝහලේ රඳවා තබා ගැනීම අවශ්‍ය නොවන බව, උපදේශක මනෝ චිකිත්සකගේ මතය වන විට,තමා නිදහස් කොට, තමාගේ දණ්ඩන නියමයේ ඉතිරි කොටස ගෙවා දැමීම පිණිස සිරගෙදරට හෝ බන්ධනාගාරය වෙත යවන ලෙස ඉල්ලා සිටීමට එම තැනැත්තාට හැකිවේ. උපදේශක වෛද්‍යවරයා විසින් නිදහස් කිරීමේ නියෝගයෙහි දක්වා ඇති පරිදි, අවශ්‍ය පසු විපරම් මානසික සෞඛ්‍ය සේවාවන්, සිරගෙදර හෝ බන්ධනාගාරය විසින් ලබාදිය යුතුය.

අදාල තැනැත්තා සුවපත් නොවූයේ නම් දණ්ඩන නියමය ඉකුත් වූ පසු තවදුරටත් කළයුතු කටයුතු.

56. 56 වන සහ 57 වන වගන්තිවල විධිවිධාන යටතේ සුව නොවූ යම් තැනැත්තෙකු ගෙන යනු ලැබුවේ යම් රෝහලක් වෙතද, එම රෝහලේ උපදේශක මනෝ චිකිත්සක විසින් එම තැනැත්තා බන්ධනාගාර ගත කරනු ලැබුවේ යම් දණ්ඩන නියමයක් යටතේ ද, එම දණ්ඩන නියමය ඉකුත්වීමට යටත් පිරිසෙයින් දවස් දහහතරකට (14) කලින්, එම කාරණය අධිකරණ අමාත්‍යවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතුය. එම දණ්ඩන නියමය අවසන්වීමෙන් අනතුරුව, යම් තැනැත්තෙකු, මෙම පනතේ V, VI සහ V11 යන කොටස්වලට අනුකූලව රෝහලේ රඳවා තබාගනු ලැබිය හැකිය.

## IX වන කොටස මානසික රෝගී සැකකාර වරදකරුවෝ

අපරාධ නඩු විභාගයක් සම්බන්ධයෙන් පොලිස් අත්අඩංගුවේ හෝ රක්ෂිත බන්ධනාගාරගතව තබා සිටින මානසික අසනීපයෙන් පෙලෙන තැනැත්තෝ.

57. (1) සාපරාධී වරදක් පිළිබඳව විමර්ශන කටයුතු සඳහා අත්අඩංගුවේ තබාගනු ලැබූ හෝ සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබූ, එහෙත් මෙතෙක් නඩු විභාග කරනු නොලැබූ හෝ සාපරාධී වරදක් සම්බන්ධයෙන් නඩු විභාග කරන තෙක් බන්ධනාගාරයේ රඳවා තබැගනු ලබන්නාවූ, 41 වන වගන්තියේ සඳහන් වන අයට අන්‍යවූ හා පොලිස් අත් අඩංගුවේ සිටින මානසික රෝගී තැනැත්තන්, පනතේ මෙම කොටසට යටත් වන්නේ ය.

(2) පනතේ මෙම වගන්තිය තුළ සාපරාධී වරද යන්නෙහි අර්ථ නිරූපණය වන්නේ, වරදේ බරපතලකම අනුව වරදකරු කරනු ලැබීමේදී, බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයන්ට තුඩුදෙන වරදකි.

රෝහලට ඇතුලත් කිරීම සඳහා වූ ඉල්ලීම.

58. (1) 57 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති ආකාරයේ, යම් තැනැත්තෙකුගේ භාරය තමන්ට ඇතැයි විශ්වාස කරන, පොලිස් ස්ථානයක ස්ථානාධිපති නිලධාරියකු හෝ බන්ධනාගාරයක් භාරව සිටින නිලධාරියකු විසින් එම තැනැත්තා මනෝ චිකිත්සක ඒකකයට ඇතුළත් කිරීම සඳහා චෝදිත වරද පිළිබඳව අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයාට හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයාට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළයුතුය.

(2) මෙම වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණුවිට, වෛද්‍ය අවශ්‍යතාවය තක්සේරු කිරීම පිණිස අදාළ තැනැත්තා, තිබෙන මනෝ චිකිත්සක ඒකකයට පැය හතලිස් අටක් (48) දක්වා කාලයකට ඇතුළත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයා, උපදේශක මනෝ චිකිත්සකවරයෙකුට, නියෝග කරනු ඇත. සැකකාර වරදකරු මෙම කාලය තුළ ඒකකයේ හෝ වාට්ටුවේ ආරක්ෂා සහිත කොටසක රඳවාතැබිය යුතුය.

තක්සේරුව

59. 62 (2) වන වගන්තියේ සඳහන් කාල පරිච්ඡේදය සහ ක්‍රියාවලිය අවසන් වීමෙන් පසුව , එනම් පැය හතලිස් අටක් (48) වන නියෝගයේ කාල පරිච්ඡේදයෙන් පසුව, එම තැනැත්තා :-

(1) මානසිකව රෝගාතුර නොවන බව, හා ඔහු හෝ ඇය කලින් සිටි භාරයට ආපසු යවනු ලැබිය හැකි බව ; හෝ

(2) ඔහු හෝ ඇය මානසිකව රෝගී බවත්, රෝහලකට ඇතුළත් කළයුතු බව , හෝ

(3) ඔහු හෝ ඇය මානසිකව රෝගී බවත්, එනමුත් සිරගෙදරදී,අත් අඩංගුවේ සිටින ස්ථානයේදී හෝ නිවසේ දී ප්‍රතිකාර කරනු ලැබිය හැකි බව,

උපදේශක මනෝචිකිත්සක විසින් අධිකරණය වෙත නිර්දේශ කරනු ඇත.

මානසික රෝගී සැකකාර වරදකරුවන් රෝහලක රඳවා තබාගැනීම.

60. මානසික රෝගී සැකකාර වරදකරුවකු රෝහලකට ඇතුළත් කළයුතු වන්නේ නම් ඒ සඳහා වූ නියෝග එක් මාසයක් සඳහා කරනු ලැබිය හැකි අතර, ඉල්ලීමක් මත තවත් මාස තුනක කාලපරිච්ඡේදයක් සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ ඉල්ලීමක් මත තවත් මාස හයක් (6) ක් දක්වාවූ කාලයක් මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් හෝ දීර්ඝ කරනු ලැබිය හැකිය. නඩු විභාගය අවසන් කරනු ලැබූ විට, සිරකරුවා රඳවා තබාගැනීම මෙම පනතේ අදාළ කොටස්වලට අනුකූල විය යුතුය.

මානසික රෝගී සැකකාර වරදකරුවන් රඳවා තැබීමෙන් නිදහස් කිරීම.

61. (1) 64 වන වගන්තියේ සඳහන් වන කාල පරිච්ඡේදය හෝ කාල පරිච්ඡේද අවසන් වූ විට සැකකාර වරදකරුවකු රෝහලෙන් නිදහස් කරනු ලැබිය හැකිය, නැතහොත් මෙම පනතේ V වන කොටස යටතේ රඳවා තබාගනු ලැබිය හැකිය.

(2) 64 වන වගන්තිය යටතේ සඳහන් කර ඇති රෝහලේ රඳවා ගනු ලැබූ කාලය තුළ, අදාළ තැනැත්තාගේ මානසික සෞඛ්‍යය වර්ධනය වුවහොත්, සහ ඒ අනුව එම තැනැත්තා තවදුරටත් රෝහලේ රඳවා ගැනීම අනවශ්‍ය බව උපදේශක මනෝචිකිත්සක ගේ මතය වන්නේ නම්, එම තැනැත්තා

වගකිවයුතු අධිකරණයේ භාරයට නිදහස් කෙරෙනු ඇත.

(3) 64 වන වගන්තිය යටතේ සඳහන් කර ඇති රෝහලේ රඳවා ගනු ලැබූ කාලය තුළ, එම තැනැත්තා වරදකට වරදකරු කරනු ලැබ මෙම පනතේ VIII වන කොටස යටතේ නියෝගයක විෂය කාරණයක් වූයේ නම්, 60 වගන්තිය යටතේ ඔහු රඳවා තබාගැනීම අවසන් වන අතර, ප්‍රතිකාර සඳහා කෙරෙන නියෝග, පනතේ VIII වන කොටස මගින් පාලනය විය යුත්තේ ය.

(4) මෙම පනත යටතේ, යම් නිදහස් කිරීමකට හෝ රඳවා තැබීම සඳහා මාරු කිරීමකට පැය හතලිස් අටකට (48) කලින් අධිකරණයට දැනුම් දිය යුතුය.

## X වන කොටස : මානසික සෞඛ්‍ය උපදේශක සභාව සහ දුක්ගැනවිලි කමිටුව පිහිටුවීම

මානසික සෞඛ්‍ය උපදේශක සභාව පිහිටුවීම.

62. මෙම පනත යටතේ පිහිටුවා ඇති අයිතිවාසිකම් සහ යුතුකම් තහවුරු කිරීමේ කාර්යය සඳහා පිහිටුවා ඇති ( මෙහි මින් මතුවට “ සභාව ” යනුවෙන් සඳහන් කරනු ලබන ) මානසික උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුත්තේය.

සංයුතිය.

63. (1) සභාව සාමාජකයන් විසි දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(2) පහත සඳහන් සාමාජකයන් නිල බලයෙන්ම පත් කරනු ලැබිය යුත්තේ ය.

(අ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ/ ඇයගේ නාමිතයකු

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ / ඇයගේ නාමිතයකු

(ඇ) මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ හෝ ඔහුගේ/ ඇයගේ නාමිතයකු

(ඈ) අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ / ඇයගේ නාමිතයකු

(ඉ) මානව හිමිකම් කොමසාරිස් හෝ ඔහුගේ හෝ ඇයගේ නාමිතයකු

(ඊ) සමාජ සේවා අමාත්‍යංශයේ ලේකම් සහ/ හෝ ඔහුගේ හෝ ඇයගේ නාමිතයකු සහ

(උ) වෘත්තියේ යෙදී සිටින මානසික සෞඛ්‍ය වෘත්තිකයන් නොවිය යුතු සෞඛ්‍ය විෂයය භාර පළාත් ලේකම්වරුන් සියළු දෙනාම හෝ ඔවුන්ගේ නාමිතයන් .

(3) සභාපතිවරයා සභාවේ සාමාජිකයන් අතරින් සභාවේ සාමාජිකයන් විසින් ඡන්දයෙන් පත්කර ගත යුතුය.

(4) අනෙක් සාමාජිකයන් හතර දෙනා අමාත්‍යවරයා විසින් පහත සඳහන් ආකාරයට පත් කරනු ලැබිය යුතුය :-

(අ) මනෝ චිකිත්සක විද්‍යාලයෙන් එක් කෙනෙකු

(ආ) වෛද්‍යවරයකු නොවන , මානසික සෞඛ්‍ය හෝ සමාජ වැඩවල යෙදෙන්නෙකු

(ඇ) මූලික සත්කාරකයන්ගේ නියෝජිතයකු

(ඈ) මානසික සෞඛ්‍ය සේවාවල ආයෝජන ලබන්නන්ගේ භාවිතා කරන්නන්ගේ නියෝජිතයකු

(5) රැස්වී තීරණ ගැනීම සඳහා සභාවේ ගණපූරණය, සභාපති හෝ ඔහුගේ හෝ ඇයගේ නාමිතයා ඇතුළුව අට දෙනෙකු විය යුතුය.

(6) සභාවේ හැම සාමාජිකයකුම, අවුරුදු හතරක කාල පරිච්ඡේදයක් ධූරය දරන්නේ ය.

(7) මාස හයක කාල පරිච්ඡේදයක් තුළ යටත් පිරිසෙයින් එක් රැස්වීමකට වත් සහභාගි නොවන සාමාජිකයකු නිලයෙන් ඉවත් කළයුතුය.

(8) තනතුරෙන් ඉවත් කරනු ලැබූ හෝ වෙනත් ආකාරයකට තනතුරෙන් ඉවත් වූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයකු, ඔහු හෝ ඇය කලින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවේ හෝ වෙනත් ආකාරයට තනතුරෙන් ඉවත් වුවහොත් මිස, ඔහු හෝ ඇය අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ නිල කාලයෙන් අවසන් වී නොමැති කාල පරිච්ඡේදය සඳහා තනතුර දැරිය යුතුය.

(9) අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් තනතුරෙන් ඉල්ලා අස්වීමට, සභාපතිවරයාට සහ සාමාජිකයන්ට හැකි වන්නේ ය.

(10) (සභාවේ හැම සාමාජිකයකුටම, අවුරුදු හතරක් (4) වන උපරිම කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් හිමි වන්නේ ය.

(11) අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් මාස තුනකට වැඩි කාලයක් තමාගේ ධූරයේ කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවකදී ඔහු හෝ ඇය වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේ ය.

(12) මුදල් විෂයය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුත්තේ ය.

අලුත් කිරීමේ කාර්ය පටිපාටිය

64. සභාව, උපදේශාත්මක ලිපි නිකුත් කිරීම මගින් මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් සහ ප්‍රතිපත්ති නිර්දේශ සැපයීම සම්බන්ධයෙන් වගකිය යුතුය.

(1) 37 වන වගන්තිය යටතේ නියමිත පරිදි අනිච්ඡානුග රෝගීන් භාර ගැනීම සඳහා මානසික සෞඛ්‍ය ඒකකවලට හෝ වාට්ටුවලට බලපත්‍ර නිකුත් කිරීම ;

(2) අනිච්ඡානුග රෝගීන් ඇතුල් කරගැනීමට මනෝ චිකිත්සකයන්ට බලය ලබාදීම ;

(3) දිස්ත්‍රික් සමාලෝචන සමිති ක්‍රියා කළ කාර්යපටිපාටි ;

(4) මානසික සෞඛ්‍ය තත්ත්වය නිශ්චය කිරීම සඳහා මඟ පෙන්වීම් කිරීම ;

(5) අවශ්‍යයයි සලකනු ලබන ආකාරයට සහ අදාළ වෘත්තිකයන්ගේ සංගම්වල සහයෝගය ඇතිව, දිස්ත්‍රික් සමාලෝචන කමිටුවල සාමාජිකයන් සහ වෙනත්

මානසික සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා පුහුණු විෂය මාලා සකස් කිරීම සහ පුහුණු සැසිවාර පැවැත්වීම ;

(6) මෙම පනතේ කාර්යයන් සහ අරමුණු ඉටුකර ගැනීම පිණිස ක්‍රියාත්මක කිරීම සඳහා සහ මානසික අසනීප ඇති තැනැත්තන්ට සත්කාර කිරීමේ නියැලී සිටින, මානසික සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අයත් සියළුම දෙනා විසින් අනුගමනය කරනු ලැබීම සඳහා පිළිවෙත් සංග්‍රහයක අන්තර්ගතය ;

(7) බන්ධනාගාරවල සහ සිරගෙවල්වල මානසික සෞඛ්‍ය සේවාවන් සැලැස්වීම අධීක්ෂණය කිරීම සඳහා වීක්ෂක මණ්ඩලයකට සාමාජිකයන් පත් කිරීම සහ එම මණ්ඩලය පාලනය කෙරෙන නියෝග පැනවීම ;

(10) රෝගීන් වෙන්කර තැබීම සම්බන්ධයෙන් නියෝගවල අන්තර්ගතය ;

පාර්ලිමේන්තුවට වාර්තා 65. සභාව විසින්-

(1) 37 වන වගන්තිය යටතේ නියමිත පරිදි අනිච්ඡානුග රෝගීන් භාරගැනීම සඳහා මානසික සෞඛ්‍ය ඒකකවලට හෝ වාට්ටුවලට බලපත්‍ර නිකුත් කිරීම ;

(2) අනිච්ඡානුග රෝගීන් ඇතුල් කරගැනීමට මනෝචිකිත්සකයන්ට බලය ලබාදීම ;

(3) දිස්ත්‍රික් සමාලෝචන සමිති ක්‍රියා කරන කාර්යපටිපාටි ;

(4) මානසික සෞඛ්‍ය තත්ත්වය නිශ්චය කිරීම සඳහා මඟපෙන්වීම් කිරීම ;

(5) අවශ්‍ය යයි සලකනු ලබන ආකාරයට සහ අදාළ වෘත්තිකයන්ගේ සංගම්වල සහයෝගය ඇතිව, දිස්ත්‍රික් සමාලෝචන කමිටුවල සාමාජිකයන් සහ වෙනත් මානසික සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා පුහුණු විෂය මාලා සකස් කිරීම සහ පුහුණු සැසිවාර පැවැත්වීම ;

(6) මෙම පනතේ කාර්යයන් සහ අරමුණු ඉටුකර ගැනීම පිණිස ක්‍රියාත්මක කිරීම සඳහා සහ මානසික අසනීප ඇති තැනැත්තන්ට සත්කාර කිරීමේ නියැලී සිටින මානසික

සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අයත් සියලුම දෙනා විසින් අනුගමනය කරනු ලැබීම සඳහා පිළිවෙත් සංග්‍රහයක අන්තර්ගතය ;

(7) බන්ධනාගාරවල සහ සිරගෙවල්වල මානසික සෞඛ්‍ය සේවාවන් සැලැස්වීම අධීක්ෂණය කිරීම සඳහා වීක්ෂක මණ්ඩලයකට සාමාජිකයන් පත්කිරීම සහ එම මණ්ඩලය පාලනය කෙරෙන නියෝග පැනවීම ;

(8) රෝගීන් වෙන්කර තැබීම සම්බන්ධ නියෝගවල අන්තර්ගතය ;

66. ඉහතකී කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කිරීම පිණිස, නියෝග මගින් පනවන ලද සීමා කිරීම්වලට යටත්ව, තුන් දෙනෙකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකින් යුත් අනු කමිටුවක් පත් කිරීමේ බලය සභාවට තිබිය යුතුය.

67 එහි වැඩ කටයුතු සම්බන්ධ වාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ;

රැස්වීම්.

68. සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි වේලාවකදී සහ ස්ථානයකදී, මාසයකට යටත් පිරිසෙයින් එක් වරක්වත් සභාව සාමාන්‍යයෙන් රැස්විය යුතුය. එසේකුදු වුවද, සභාපතිවරයා විසින්,

(1) සභාවේ අවධානය යොමු විය යුතු හදිසි කාරණයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස කවර අවස්ථාවකදී වුවද, විශේෂ රැස්වීමක් කැඳවිය හැකිය.

(2) සාමාජිකයන් හතර දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් අත්සන් කරන ලද සහ රැස්වීමක් කැඳවීමට තමන් අපේක්ෂා කරන්නේ කවර කාරණයක් සඳහා ද යන බව සඳහන් වන්නාවූ ලිඛිත ඉල්ලීමක් ලැබුණහොත්, විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය.

කාර්ය මණ්ඩලය

69. සභාවට ස්වකීය වැඩ කටයුතු ඵලදායී ලෙස ඉටු කරගැනීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය, ඉඩකඩ, උපකරණ සහ

වෙනත් පහසුකම් අමාත්‍යවරයා විසින් සභාවට ලබාදිය යුතුය.

සභාවේ වියදම් 70. සභාපතිවරයාගේ සහ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික සහ වියදම් ද, පනතේ ක්‍රියාකාරීත්වය යටතේ දරනු ලබන වෙනත් වියදම් ඇතුළු සභාවේ වියදම් එම කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් ලබාදෙන ලද මුදල්වලින් ගෙවිය යුතුය. රජයේ යම් මුදල් වර්ෂයක් සම්බන්ධ වියදම් දැරීමට අවශ්‍ය වන මුදල්, අමාත්‍යංශය විසින් එම මුදල් වර්ෂයේ ඇස්තමේන්තුවලට ඇතුළත් කරනු ලැබිය හැකිය.

දුක්ගැනවිලි කමිටුව 71. ප්‍රකාශයට පත් කරන ලද නියෝගවලට අනුකූලව දුක්ගැනවිලි කමිටුව පිහිටුවිය යුතුය.

72. දුක්ගැනවිලි කමිටුවට :

(1) දිස්ත්‍රික් සමාලෝචන කමිටුවල තීරණ සහ ක්‍රියා සම්බන්ධ අභියාචනා දවස් තිහක් (30) ඇතුළත සමාලෝචනය කිරීමට,

(2) එක් එක් රෝගියාගේ ප්‍රශ්න විමර්ශනය කිරීම සහ අභියාචනා විභාග කිරීමට ;

(3) සාක්ෂිකරුවන් කැඳවීමට සහ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ; සහ

(4) අනුගම්‍ය තීරණ සහ ආඥා නිකුත් කිරීම.

73. දුක් ගැනවිලි කමිටුවේ තීරණවලට විරුද්ධව, මෙම පනතේ හෝ මින්මතුවට දැක්වෙන නියෝගවල දක්වා ඇති ආකාරයට, කවරවූ හෝ දිසා අධිකරණයකට අභියාචනා කළ හැකි වන්නේ ය.

## XI වන කොටස : දිස්ත්‍රික් සමාලෝචන කමිටු පිහිටුවීම

දිස්ත්‍රික් සමාලෝචන කමිටු පිහිටුවීම. 74. (1) පැමිණිලි විමර්ශනය කිරීමත්, මෙම පනතේ සඳහන් වන මානසික, සෞඛ්‍ය සේවා භාවිතා කරන්නන් විසින් සහ ඔවුන් වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම් සහ යොමු කිරීම්

සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස මෙහි මින්මතුවට “ කමිටු” යනුවෙන් සටහන් කරනු ලබන, දිස්ත්‍රික් සමාලෝචන කමිටු එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටුවනු ලැබිය යුතුය.

(2) එක් එක් කමිටුවක් දිස්ත්‍රික්කයේ පදිංචි අයගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන්ගෙන් දෙදෙනෙකු මනෝ චිකිත්සකයන් නොවිය යුතුය.

(3) කමිටුවලට කළයුතු පත්වීම්, එක් එක් පළාතේ සෞඛ්‍ය විෂය භාර පළාත් ලේකම් විසින් කළ යුත්තේ ය.

(4) තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් කලින් තනතුරෙන් ඉවත් වුවහොත් මිස, කමිටුවක හැම සාමාජිකයකුම අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් ධුරය දැරිය යුතුය.

එසේකුදු වුවද, තනතුරෙන් ඉවත් කරනු ලැබූ හෝ වෙනත් ආකාරයකට තනතුරෙන් ඉවත් වූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයකු, ඔහු හෝ ඇය කලින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවේ හෝ වෙනත් ආකාරයට තනතුරෙන් ඉවත් වුවහොත් මිස, ඔහු හෝ ඇය අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ නිල කාලයෙන් අවසන් වී නොමැති කාල පරිච්ඡේදය සඳහා ධූරය දැරිය යුතුය.

(5) (අ) සභාවේ සභාපතිවරයා අමතන ලද ලිපියක් මගින් තනතුරෙන් ඉල්ලා අස්වීමට සාමාජිකයකුට හැකි වන්නේය.

(ආ) කිසිම හේතුවක් නොදක්වා මුළු සභාවේ යෝජනා සම්මතයක් මගින්, කමිටුවේ සාමාජ-කයකු තනතුරෙන් ඉවත් කිරීමට සභාවට හැකි වන්නේ ය.

(ඇ) කමිටුවේ සාමාජිකයන්ගේ පූර්ණ සහභාගිත්වය තහවුරු කරනු පිණිස පළාත් ලේකම් විසින් නියමිත රෙගුලාසිවලට

අනුකූලව කලින් කල කමිටුවේ වාර්තා සමාලෝචනය කළ යුතුය. කමිටුවක සාමාජිකයකු කමිටුවේ කටයුතුවලට සහභාගි නොවන්නේ හෝ අන්‍යාකාරයකට, කමිටුවේ වගකීම් සාර්ථකව ඉටු කරන්නේ නොමැති නම්, පළාත් ලේකම් විසින්, ඒ බව සභාවට දැනුම් දිය යුතුය. එවිට සභාව විසින් එම සාමාජිකයා කමිටුවෙන් ඉවත් කළයුතු අතර, නියමිත රෙගුලාසිවලට අනුකූලව එම සාමාජ්-කයාට දඬුවම් කළ යුතුය.

(ඇ) අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට ගෙන තමාගේ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවකදී, ඔහු හෝ ඇය වෙනුවට සාමාජිකයකු වශයෙන් වෙනත් යම් තැනැත්තෙකු සභාවේ සභාපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි වන්නේ ය.

(ඉ) රැස්වීී තීරණ ගැනීම සඳහා එක් එක් කමිටුවේ දෙදෙනෙකුගෙන් යුත් ගණපූරණයක් අවශ්‍ය වන්නේ ය.

(ඊ) කමිටුවක සියළුම තීරණ සඳහා, අවම වශයෙන් කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකුගේ සහාය අවශ්‍ය වේ.

(උ) එක් එක් කමිටුවේ සාමාජිකයන්ට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සමග සාකච්ජා කොට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාර්ශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැක්කේ ය.

(ඌ) කමිටුව විසින් නියමිත රෙගුලාසිවලට අනුව වාර්තා පවත්වාගෙන යායුතු අතර, තීරණ ලේඛනගත කර තැබිය යුතුය.

(6) කමිටුවක හැම සාමාජිකයකුම අවුරුදු හයක් වන උපරිම කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුත්තේ ය.

රෝගී සිරකරුවන්

75. එක් එක් කමිටුව විසින් :-

(1) 36 වන වගන්තිය යටතේ අනිච්ඡානුග හෝ හදිසි ඇතුළත් කිරීම් සහ රඳවා තබාගැනීම් පිළිබඳ අභියාචනා විභාග කිරීම.

(2) 13 වන වගන්තියට අනුව, පැමිණිලි විමර්ශණය කොට නිසි ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගතයුතුය ;

(3) තමන්ගේ වගකීම් ප්‍රදේශය තුළ පිහිටි බලපත්‍රලත් මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථාන බලපත්‍ර ලබාදීමේ නියමයන්ට අනුව කටයුතු කරන බවට වගබලාගනු පිණිස මාසයකට එක් වරක් පරීක්ෂා කළයුතු අතර, වාර්තා සහ ලියකියවිලි නිසි පිළිවෙළට තිබෙන බවට වගබලා ගැනීම පිණිස ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකිය ;

(4) සිරගෙවල්වල සහ බන්ධනාගාරවල මානසික සෞඛ්‍ය සේවාවන් සැපයීම අධීක්ෂණය කළයුතු අතර, පවත්නා මානසික සෞඛ්‍ය පහසුකම් වාර්ෂිකව පරීක්ෂා කිරීමද එයට ඇතුළත් විය යුතුය.

(5) අවශ්‍යයයි කමිටුව සලකන්නේ නම්, එබඳු පහසුකමක තත්ත්වය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන්, මනෝ චිකිත්සක ඒකකයකට, අධිකාරියට සහ ආණ්ඩුව නිර්දේශ ඉදිරිපත් කිරීම.

(6) 13 වන වගන්තිය යටතේ හැකියාව නිශ්චය කිරීම සමාලෝචනය කිරීම ;

(7) 14 වන වගන්තිය යටතේ, මානසික සෞඛ්‍ය සේවයේ ප්‍රයෝජනය ලබන්නන්ගෙන් තොරතුරු වසන් කිරීම සමාලෝචනයට භාජනය කිරීම ;

(8) 21 වන වගන්තිය යටතේ, තුවාල කිරීම් සහ මරණ පිළිබඳ වාර්තා විමර්ශණය කිරීම ;

76. (1) මෙම පනත මගින් ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා ඇති අවස්ථාවලදී සහ වේලාවන්හිදී හැර කමිටුවක් වෙත කෙරෙන අභියාචනා, එම අභියාචනා සම්බන්ධයෙන් නිශ්චය කරනු ලබන රෙගුලාසි යටතේ ඉදිරිපත් කළ යුතුය.

කමිටුවක් වෙත කෙරෙන අභියාචනා

(2) රෝහලක මානසික සෞඛ්‍ය ඒකකයකට ඇතුළත් කරන ලදුව, ඉන් අනතුරුව මෙම පනතේ VI වන කොටස යටතේ රඳවා තබාගනු ලබන රෝගියකු විසින්, ඔහු හෝ ඇය එසේ ඇතුළත් කරන ලද දිනයෙන් පසුව කවර අවස්ථාවකදී හෝ කමිටුවකට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(3) රඳවා තබාගනු ලැබූ රෝගියකු හෝ කමිටුව වෙත අභියාචනයක් කිරීම සඳහා ඔහු හෝ ඇය වෙනුවෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් රඳවා තබාගැනීම හෝ ප්‍රතිකාර සම්බන්ධයෙන් එම නියෝගයේ කාල පරිච්ඡේදය තුළ, ඉදිරිපත් කළ හැක්කේ, එක් ඉල්ලුම් පත්‍රයක් පමණකි.

(4) කමිටුව වෙත කෙරෙන අභියාචනා , රෝගියා විසින් මනෝ චිකිත්සක හෝ ළඟම නෑයා හෝ ළඟම නෑයා වෙනුවෙන් කටයුතු කරන තැනැත්තකුගේ සහාය ඇතිව, ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. දැනුම පදනම් කරගත් කැමැත්ත දීමට රෝගියාට නොහැකි වුවහොත්, ඉල්ලුම්පත්‍රය, ඔහු හෝ ඇය වෙනුවෙන්, ඔහුගේ හෝ ඇයගේ කැමැත්ත නොමැතිව, ළඟම නෑයා හෝ ළඟම නෑයා වෙනුවෙන් කටයුතු කරන තැනැත්තා විසින් ඉදිරිපත් කළ යුතුය.

77. කමිටුවල තීරණය සම්බන්ධයෙන්, මෙම පනතේ හෝ ඉදිරියේදී

කමිටු තීරණ සම්බන්ධ

අභියාචනා

පනවනු ලබන රෙගුලාසිවල සඳහන් වන ආකාරයකට අභියාචනා ඉදිරිපත් කළයුතුවේ.

කමිටුවකට යොමු කිරීම සඳහා අමාත්‍යවරයා සතු බලතල.

78. පනතේ විධිවිධාන යටතේ රඳවා තබාගනු ලැබීමට යටත් කවරවූ හෝ නිලධාරීන් සම්බන්ධ අවස්ථා, නිසි පසු විපරම් සඳහා අමාත්‍යවරයා විසින් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

## XII වන කොටස : වෙනත් නීති අදාළ කරගැනීම

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXI වන පරිච්ජේදය අදාළ කර ගැනීම.

79. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXI වන පරිච්ජේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මෙම පනත යටතේ පැවැත්වෙන අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන්, අදාළ විය යුත්තේ ය.

80. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXI වන පරිච්ජේවයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම පනත යටතේ පවත්වන අපරාධ නීති කෘත්‍ය සම්බන්ධයෙන් අදාළ විය යුත්තේ ය.

අධිකරණ සංවිධාන පනතේ IVවන පරිච්ජේදය අදාළ කර ගැනීම.

81. අධිකරණ සංවිධාන පනතේ IX වන පරිච්ජේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මෙම පනත යටතේ, මානසික රෝගී තැනැත්තන්ගේ බූදල් සම්බන්ධයෙන් අදාළ විය යුත්තේ ය.

## XIII වන කොටස : පොදු

නීති කෘත්‍යයන් මුද්දර ගාස්තු වලින් නිදහස් විය යුතු බව.

82. මෙම පනතේ විධිවිධාන යටතේ අධිකරණයෙහි ගොනු කරනු ලබන යම් ඉල්ලුම්පතක්, කැඳවීම් නියෝගයක් හෝ වෙනත් ලේඛනයක් සඳහා මුද්දර ගාස්තු සම්බන්ධ වන්නේ හෝ ගෙවිය යුතු වන්නේ නැත.

වරදවල්

83. (1) (අ) මෙම පනතෙහි යම් විධිවිධානයක් හිතමතාම උල්ලංඝනය කරනු ලබන ;

(ආ) මෙම පනතෙහි කාර්යයන් සඳහා, ඔහුගේ හෝ ඇයගේ දැනුම අනුව අසත්‍ය හෝ වැරදි සහගත යම් තොරතුරක් හෝ කරුණු ඇතුළත් ලියවිල්ලක් හෝ කරුණු කොටසක් ඇති ලියවිල්ලක් සපයනු ලබන, හෝ

(ඇ) මානසික සෞඛ්‍ය උපදේශක සභාවේ නියෝගයක් පිළිපැදීමට අසමත් වන,

යම් තැනැත්තකු, මෙම කොටස මගින් සහ නියමිත රෙගුලාසි මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, වරදකට වරදකරු වන අතර රුපියල් පන් දහසක් නොඉක්මවන දඩ මුදලක් හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

(2) මානසික අසනීපයක් සඳහා මානසික සෞඛ්‍ය රෝහල් ඒකකයක හෝ වාට්ටුවක රෝගියකු වශයෙන් ප්‍රතිකාර ලබන යම් තැනැත්තකුහට එසේ ප්‍රතිකාර ලබන කාලසීමාව තුළදී වැරදි සහගත ලෙස සලකන, අපයෝජනයට ලක් කරනු ලබන, පීඩා කරනු ලබන හෝ ඕනෑකමින්ම නොසලකා හරින එම මානසික සෞඛ්‍ය රෝහල් ඒකකයේ හෝ වාට්ටුවේ කාර්ය මණ්ඩලයට අයත් යම් සේවකයකු, වරදකට වරදකරු වන අතර රුපියල් විසිදහසකට නොඅඩු දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු අතර එම මානසික සෞඛ්‍ය පහසුකම් සලස්වනු ලබන ආයතනයේ සේවකයකු වශයෙන් සිටීම අවසන් විය යුතුය.

(3) නීතිපතිවරයාගේ එකඟත්වය මගින් හෝ ඇතිව හෝ මිස (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා නීති කෘත්‍යයක් ආරම්භ කරනු නොලැබිය යුතුය.

(4) මනෝචිකිත්සක ඒකකයක් බලපත්‍රයක් රහිතව ක්‍රියාත්මක කරනු ලබන්නේ නම්, එම පහසුකම් ස්ථානය රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

(5) යම් අවස්ථාවක දිස්ත්‍රික් සමාලෝචන කමිටුවට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ 74 වන වගන්තිය යටතේ එකී පහසුකම් ස්ථානය පරීක්ෂා කිරීමට බාධා කරන මානසික සෞඛ්‍ය පහසුකම භාරව සිටින වෛද්‍ය

නිලධාරියා, වරදකට වරදකරු වන අතර, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

ව්‍යාජ, සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශන හෝ ප්‍රකාශ.

84. මානසික අසනීප රෝගීන් ඇතුළ් කිරීම සම්බන්ධයෙන් කවර හෝ ආකාරයකින් ඍජුව හෝ වක්‍රව යම් ව්‍යාජ වැරදි සහගත හෝ අසත්‍ය ප්‍රකාශන හෝ ප්‍රකාශ සිදුකරනු ලබන යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, දිසා අධිකරණය හෝ මහාධිකරණය ඉදිරිපිටදී වරදකරු කිරීමෙන් පසුව, රුපියල් දහදහසක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

රෝගීන් සමග ලිංගික සම්බන්ධකම් පැවැත්වීම.

85. (1) මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානය සේවකයකු වන යම් තැනැත්තකු විසින් බාහිර හෝ අභ්‍යන්තර රෝගියකු වශයෙන් මානසික අසනීපයක් සඳහා ප්‍රතිකාර ලබන යම් තැනැත්තකු සමග, එසේ ප්‍රතිකාර ලබන කාලසීමාව තුළදී ,එම ඒකකයේ පරිශ්‍රය ඇතුළත ලිංගික සම්බන්ධතා පැවැත්වීම වරදක් විය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීමට යන දෙකටම හෝ යටත් විය යුතුය.

(3) නීතිපතිවරයා විසින් හෝ ඔහුගේ අවසරය ඇතිව හෝ මිස (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා නීති කෘත්‍ය ආරම්භ කරනු නොලැබිය යුතුය.

අභියාචනාධිකරණය වෙත අභියාචනා

86. මෙම පනතෙහි විධිවිධාන යටතේ දිසා අධිකරණයක් මගින් කරනු ලබන සෑම නියෝගයක් හෝ තීරණයක්ම, ඒ පිළිබඳව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබීමට යටත් විය යුතුය.

87. දිසා අධිකරණයක අන්තර් නියෝගයක් සම්බන්ධයෙන් අභියාචනය ඉදිරිපත් කිරීම සහ ගොනු කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නාවූ කාලසීමාව, රීතින් සහ ව්‍යවහාරය, මෙම පනත යටතේ

ඉදිරිපත් කරනු ලබන අභියාචනයන් සඳහා අදාළ විය යුතුය.

88. එවැනි අභියාචනයක් අභියාචනාධිකරණය විසින් සලකා බැලිය යුතු අතර, දිස්ත්‍රික් අධිකරණයක අන්තර් නියෝගයක් පිළිබඳ අභියාචනයක් ලෙස කටයුතු කර, අභියාචනාධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන නියෝගයක් ඒ පිළිබඳව කරනු ලැබිය යුතුය. එවැනි නියෝගයක් පිළිපැදීම හා ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් අධිකරණයේ කාර්ය භාරය විය යුතුය.

රෙගුලාසි

89. (1) මෙම පනත මගින් නියම කර ඇති යම් කරුණක් හෝ මෙම පනත මගින් රෙගුලාසි සෑදීම සඳහා බලය ලබාදී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රෙගුලාසි සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට හෝ රෙගුලාසියේ නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව පහසුවෙන් කළහැකි ඉක්මනින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලබන සෑම නියෝගයක්ම එසේ අනුමත නොකරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සහ ඊට පෙර ඒ යටතේ සිදු කරන ලද යම් කිසිවකට අගතියක් නොවන පරිදි අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් එසේ අවලංගු කරන ලද බවට සැලකිය යුතු දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

යම් ලිඛිත නීතියක "සිහිවිකලත්වය" සහ " මානසික අඩුපාඩුකම් සහිත පුද්ගලයකු " යන වචන වෙනුවට " මානසික අසනීපය " යන වචනය ආදේශ

90. මෙම පනතට අදාළ යම් ලේඛනයක හෝ යම් ලිඛිත නීතියක "සිහිවිකලත්වය" සහ "මානසික අඩුපාඩුකම් සහිත පුද්ගලයා" යන සෑම සඳහන් කිරීමක්ම, මෙම පනතෙහි " මානසික අසනීපය" යන පදයෙහි අර්ථය තුළට ගැනෙන සඳහන් කිරීමක් ලෙස කියවා අර්ථ නිරූපණය කර ගතයුතුය.

කිරීම.

අවලංගු කිරීම

91. මානසික රෝග ආඥාපනත ( 559 වන අධිකාරය) මෙයින් අවලංගු කරනු ලැබේ.

අන්තර් විධිවිධාන

92. මානසික රෝග ආඥාපනත (559 වන අධිකාරය) අවලංගු කිරීම නොතකා:-

(1) එම ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන හෝ සාදනු ලබන යම් නියෝගයක් හෝ ඉල්ලීමක්, මෙම පනතෙහි අදාළ විධිවිධාන යටතේ සාදනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර එසේ සාදනු ලැබූ ලෙස ඒ පිළිබඳව ක්‍රියාකරනු ලැබිය හැකිය ;

(2) මෙම ආඥාපනතෙහි විධිවිධාන ප්‍රකාරව යම් තැනැත්තකු රඳවා ගැනීම සඳහාවූ සහ මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවූ දින සිට බලපවත්වනු ලැබූ යම් වරෙන්තුවක් හෝ නියෝගයක් මෙම පනතෙහි අදාළ විධිවිධාන යටතේ නිත්‍යානුකූල වශයෙන් නිකුත් කරන ලද ලෙස සලකනු ලැබිය යුතු අතර, එය අවලංගු කරනු ලබන හෝ වෙනස් කරනු ලබන තෙක් බලාත්මකව තිබිය යුතුය.

(3) එම ආඥාපනත යටතේ පත් කරනු ලැබූ මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙර එයින් නිදහස් කරනු නොලැබූ යම් කළමනාකාරවරයකු හෝ දේපළ ආරක්ෂකයකු මෙම පනතෙහි අදාළ විධිවිධාන යටතේ පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම ආඥාපනත යටතේ ඔහු වෙත පවරනු ලබන යම් බලතල සහ කර්තව්‍ය මෙම පනතෙහි විධිවිධාන යටතේ පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) එම ආඥාපනතෙහි විධිවිධාන ප්‍රකාරව ආරම්භ කරන ලදුව, මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින අවසන් කරනු නොලැබූ යම් පරීක්ෂණයක් හෝ වෙනත් නීති කෘත්‍යයක් මෙම පනත යටතේ ආරම්භ කරන ලද මෙන් මෙම පනතෙහි අදාල විධිවිධාන යටතේ සහ ක්‍රියාත්මක කරනු හා පවත්වාගෙන යනු ලැබිය යුතුය.

අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

93. සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අ නනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අර්ථ නිරූපණය

94. මෙම පනතෙහි, පද සම්බන්ධයට අනුව අන්‍යාකාරයෙන් සඳහන් කර ඇතොත් මිස -

(1) " නිවාඩු ලබානොගෙන සේවයට නොපැමිණීම " යන්නෙන් රෝගියකු මෙම පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබීමට සහ රඳවා තබා ගනු ලැබීමට යටත් යම් මානසික ඒකකයක හෝ වෙනත් ස්ථානයක සේවයට නොපැමිණීම අදහස් වේ.

(2) " හැකියාව " යන්නෙන් තීරණ ගැනීමට හෝ යම් නිශ්චිත ක්‍රියාදාමයක නිරතවීමට අවශ්‍ය මානසික හැකියාවක් තිබීම අදහස් වේ.

(3) " ප්‍රජා ප්‍රතිකාර නියමය " යන්නෙන් රෝගියකු මුදා හරිනු ලැබූ විට, අඛණ්ඩ සත්කාරය සහ ප්‍රතිකාර නියම කරනු ලබන ලිඛිත ලේඛනයක් අදහස් වේ.

(4) " උපදේශක මනෝ චිකිත්සක " යන්නෙන් වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ මනෝ චිකිත්සාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබන අවශ්‍ය සුදුසුකම් සහිත යම් වෛද්‍ය නිලධරයකු අදහස් වේ.

(4) " භාරකරු " යන්නෙන් ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ අර්ථය අදහස් විය යුතුය ;

(5) " රෝහල " යන්නෙන් යම් රජයේ හෝ පෞද්ගලික රෝහලක් අදහස් වේ.

(6) “ දැනුම පදනම් කරගත් කැමැත්ත” යන්නෙන් රෝගියාට තේරුම් ගතහැකි භාෂාවකින් සහ ආකාරයකින් ප්‍රමාණවත් හා තේරුම් ගතහැකි තොරතුරු රෝගියා වෙත සුදුසු පරිදි අනාවරණය කිරීමෙන් පසුව තර්ජන හෝ අයුතු පෙළඹවීම නොමැතිව නිදහස්ව ලබාගනු ලබන කැමැත්ත අදහස්වේ ;

(7) “ අනිච්ඡානුග ” යන්නෙන් දැනුම පදනම් කරගත් කැමැත්තක් නොමැතිව යන්න අදහස් වේ ;

(8) “ වෛද්‍ය නිලධරයා ” යන්නෙන් වෛද්‍ය ආඥා පනත යටතේ ලියාපදිංචිවී ඇති සහ ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචිවී ඇති වෛද්‍ය වෘත්තිකයකු අදහස් වේ ;

(9) “ මානසික සෞඛ්‍ය ” යන්නෙන් පුද්ලයන් විසින් ඔවුන්ගේ හැකියාවන් හඳුනා ගන්නාවූද දෛනික ක්‍රියාකාරිත්වය සඳහා කටයුතු සිදු කිරීමට ජීවිතයේ සාමාන්‍ය ආතතීන් සඳහා මුහුණදීමට, වෙනස්කම් සඳහා අනුවර්තනය වීමට, ඵලදායීවීමට හැකියාව ඇත්තාවූද , අනෙකුත් පුද්ගලයන් සමග තෘප්තිමත් සබඳතා ඇත්තාවූ සහ ඔවුන්ගේ වයස, කායික හැකියාව සහ සමාජ හා භෞතික පරිසරය අනුව ඔවුන්ගේ ප්‍රජාව සහභාගි වෙන්නාවූද ශාරීරික සනීප තත්ත්වයක් අදහස් කෙරේ ;

(10) “ මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථාන ” යන්නෙන් මනෝ චිකිත්සක ඒකකයක්, පුනරුත්ථාපන පහසුකම් ස්ථානයක් හෝ දීර්ඝකාලීන පහසුකම් ස්ථ,ානයක් අදහස් වේ .;

(11) “ මානසික සෞඛ්‍ය වෘත්තිකයකු ” යන්නෙන් මානසික සෞඛ්‍ය පහසුකම් ස්ථානයක සේවයේ යෙදී සිටින සහ රජය විසින් පිළිගත් සුදුසුකමක් ඇති මානසික සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක සාමාජිකයකු අදහස් වේ.

(12) “ මානසික සෞඛ්‍ය සේවාවන් ” යන්නෙන් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම, මානසික අසනීප වැළැක්වීම හෝ මානසික අසනීපවලින් පෙළෙන තැනැත්තන් සඳහා සත්කාර, ප්‍රතිකාර, අඛණ්ඩ සත්කාරය හෝ පුනරුත්ථාපනය සැලැස්වීමට අරමුණ සහිත

අපේක්ෂා කරන රාජ්‍ය, රාජ්‍ය නොවන හෝ පුද්ගලික අංශය මගින් සපයනු ලබන සියලුම සේවාවන් අදහස් වේ.

(13) " මානසික අසනීපය " යන්නෙන් තැනැත්තකුගේ මානසික ක්‍රියාකාරීත්වය තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් බරපතල ලෙස දුර්වල කෙරෙන සහ පහත සඳහන් රෝග ලක්ෂණයන් එකක් හෝ කිහිපයක් යම් තැනැත්තකු වෙත පැවතීමේ ලක්ෂණයෙන් යුක්ත වන ICD-10 යනුවෙන් ලැයිස්තු ගත කර ඇති තත්ත්වයන් අදහස් කෙරේ.

(අ) මුලාව ;

(ආ) භ්‍රාන්තය ;

(ආ) සිතන ආකාරයේ පවතිනු ලබන බරපතල අක්‍රමිකතාවයක් ;

(ඇ) චෛතසික ස්වභාවයේ බරපතල වෙනස්වීමක් ;

(ඇ) (අ) සිට (ඇ) දක්වා වූ ඡේදයෙන්හි දක්වා ඇති රෝග ලක්ෂණ එකක් හෝ කිහිපයක් පැවතීම පෙන්නුම් කරනු ලබන ස්ථිර හෝ වරින්වර සිදුවන අතාර්කික හැසිරීම.

(14) " අමාත්‍ය " යන්නෙන් අන්‍යාකාරයෙන් දක්වා ඇතොත් මිස සෞඛ්‍යය විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

(15) " අමාත්‍යංශය " යන්නෙන් අන්‍යාකාරයෙන් දක්වා ඇතොත් මිස සෞඛ්‍ය අමාත්‍යංශය අදහස් වේ.

(16) " ළඟම ඥාතියා " යන්නෙන් ,

(අ) ස්වාමිපුරුෂයා හෝ බිරිඳ ;

(ආ) පුත්‍රයා හෝ දියණිය ;

(ඇ) පියා හෝ මව

(ඇ) සහෝදරයා හෝ සහෝදරිය

(ඉ) සීයා හෝ ආච්චි

(ඊ) මුණුබුරා හෝ මිණිබිරිය

(උ) මාමා හෝ නැන්දා ; හෝ

(ඌ) බෑණා හෝ ලේලි අදහස් වේ.

( 17) " රෝගියා " යන්නෙන් අභ්‍යන්තර රෝගී මානසික සෞඛ්‍ය සේවාවන් ලබාගනු ලබන තැනැත්තකු අදහස් වේ.

(18) " මූලික සත්කාරකරු " යන්නෙන් මානසික අසනීපයක් සහිත තැනැත්තකු සඳහා සත්කාරය සැලසීමේ ප්‍රධාන වගකීම දරන ලද පවුලේ සාමාජිකයකු හෝ වෙනත් තැනැත්තකු අදහස් වේ.

(19) " මනෝ චිකිත්සක ඒකකය " යන්නෙන් අභ්‍යන්තර රෝගී වාට්ටුවක් හෝ රජයේ රෝහලක හෝ අනුමත පෞද්ගලික රෝහලක හෝ මෙම පනතේ නම්කර ඇති මානසික රෝගී තැනැත්තන් කළමණාකරණය කිරීම සඳහා වන පහසුකම්වලින් සමන්විත විශේෂ මානසික රෝහලක නේවාසික පහසුකමක් අදහස් වේ.

(20) " ආරක්ෂිත " යන්නෙන් අවුරුද්දේ සෑම දිනක් සඳහාම දිනකට පැය විසි හතරක ආරක්ෂාව අදහස් වේ.

(21) " ශ්‍රී ලංකා වෛද්‍ය සභාව " යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද සභාව අදහස් වේ : සහ

(22) " ස්වේච්ඡාවෙන් " යන්නෙන් දැනුම පදනම් කරගත් කැමැත්ත සහිතව යන්න අදහස් වේ.

උපලේඛනය

හැකියාව තීරණය කිරීමේ ආකෘති පත්‍රය (11 වගන්තිය)

1. .. . . . . . . . . . . .. . . . . .. . . . . . . හි පදිංචි . . . . . . . . . . . . . . .. වන මම පහත සඳහන් පරිදි මෙයින් ප්‍රකාශ කර සිටිමි.

(අ) මම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වෙමි.

(ආ) එකී . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .යන අය මා විසින් 20. . . . . . . . . . . . .. . . . . . මස . . . . . දින පරීක්ෂා කරන ලදී.

(ඇ) මෙම තැනැත්තා

- තතුදත් කැමැත්ත දැනුම්දීම
- මූල්‍යමය තීරණ ගැනීම
- වෙනත් එනම්

සඳහා හැකියාවෙන් - යුක්ත බවට හෝ යුක්ත නොවන බවට මා විසින් තීරණයකට එළඹෙන ලදී.

(ඈ) තතුදත් කැමැත්ත දැනුම් දෙනු ලැබීම සඳහා එම තැනැත්තාට හැකියාවක් නොමැති නම්, එම නොහැකියාව සඳහා හේතු පහත පරිදිවේ.

2. මා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ :

අත්සන් කළේ :-. . . .. . . . . . . . . . . . .. .
වෛද්‍ය සුදුසුකම් : . . . . . . . . . .. . . . . . ..
දිනය : . . . . . . . . . . . . .. . . . . .

* තතු දත් කැමැත්ත යන්නෙන් රෝගියාට තේරුම් ගත හැකි භාෂාවකින් සහ ආකාරයකින් ප්‍රමාණවත් හා තේරුම් ගත හැකි තොරතුරු රෝගියා වෙත සුදුසු පරිදි අනාවරණය කිරීමෙන් පසුව තර්ජන හෝ අයුතු පෙළඹවීම්වලින් තොරව නිදහස්ව ලබාගනු ලබන කැමැත්ත අදහස් වේ.

<u>මුදාහැරීම සඳහා ආකෘති පත්‍රය</u> (21 වග)

. . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . .. . . .
(ලිපිනය)හි පදිංචි . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . .. .(නම)
යන අය . . . . . . . . . . . . . . . . . දින සිට මෙයින් මුදා හරිමි.

1. . . . . . . . .. . . . . . . .. . . . . . . . . . . . . . . . . .. . හි පදිංචි . . . . . .. .. . . .. . . . .. .. .. . . . . . . .. . . . . . . වන මම පහත සඳහන් පරිදි මෙයින් ප්‍රකාශ කර සිටිමි :

   (අ) මම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වෙමි.

(ආ) එකී . . . .. . . . . . . . . . . . .. . . . . . .. . . . යන අය මා විසින් 20. . . . . . . . .. . . . . . . . .. . . . . මස .. . . .දින පරීක්ෂා කරන ලදී.

(ඇ) මෙම තැනැත්තා මෙම මානසික සෞඛ්‍ය පහසුකම් සලස්වනු ලබන ආයතනයෙන් මුදාහැරිය හැකි බවට මා විසින් තීරණයකට එළඹෙන ලදී.

(ඇ) පහත සඳහන් ප්‍රතිකාර මාලාව තවදුරටත් පවත්වා ගෙන යා යුතුය.

2. මෙම රෝගියා පසු විපරම් සත්කාරය සඳහා . . .. . . . . . . . . . . . . . . . .. .. . . යෙත යොමු කරනු ලැබේ. මුණගැසීම් සඳහා තොරතුරු ලබාගැනීම :. . . . . . . . . .. . . . . . . . .. . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . .වෙතිනි.

අත්සන් කළේ :. .. . . . . . . . . .. . . . ..
වෛද්‍ය සුදුසුකම්:. . . . . . . . . . .. .
දිනය :.. . . . .. . . . . . .. .. . . . . . ..

<u>අනිච්ඡානුග සහ හදිසි ඇතුළත් කිරීම සඳහා වන</u>
<u>ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය ( 37 වග)</u>

.. . . . . . . . . . . . .දින උපන් . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . .. . . . (ලිපිනය) හි පදිංචි. . .. . . . . . . . . .. . . . . . . . . . .. . . . . . . . . යන අය අනිච්ඡානුගව ඇතුළත් කිරීම සඳහා ඉල්ලීම.

ඉහත නම සඳහන් තැනැත්තා මානසික සෞඛ්‍ය පහසුකම් සලස්වනු ලබන ආයතනයක් වෙත ඇතුළත් කළයුතු බවට පහත සඳහන් හේතු මත අපි විශ්වාස කරමු.

අනිච්ඡානුග ඇතුළත් කිරීම සඳහා වන මානසික සෞඛ්‍ය පහසුකම් සලස්වනු ලබන ආයතනය භාර වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය මෙයට අමුණා තිබිය යුතුය.

අත්සන් කළේ :-. . . . . . .. . . . . . . . . . . . . . . .. . . . . .
නම :- .. .. . . . . . .. . . . . . .. . . . . . . . . . . . .. . . . . . .
ඥාති සබඳතාවය/ තත්ත්වය : *. . . . . . . . . . . . . . . . . .
දිනය : . . . . . . . . . . . . . . . . .

අත්සන් කළේ :-. . . . . . .. . . . . . . . . . . . . . . .. . . . . .
නම :- .. .. . . . . . .. . . . . . .. . . . . . . . . . . . .. . . . . . .
ඥාති සබඳතාවය/ තත්ත්වය : *. . . . . . . . . . . . . . . . . .
දිනය : . . . . . . . . . . . . . . . . .

* පහත සඳහන් තැනැත්තන් දෙදෙනෙකුගේ අත්සන් අවශ්‍ය වේ : වෛද්‍ය වෘත්තිකයා හෝ වෙනත් සෞඛ්‍ය සේවකයකු **සහ** ලඟම ඥාතියා හෝ භාරකරු, පොලිස් නිලධාරියකු ප්‍රජා මානසික සෞඛ්‍ය සේවකයකු හෝ වෙනත් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයක් .

## <u>අනිච්ඡානුග හා හදිසි ඇතුළත් කිරීම සඳහා</u>
## <u>වන නිර්දේශයේ ආකෘතිය</u> (37 වග.)

. . . . .. . . . . . . . . . . . . . .. . . . . . . .. . . . .. . . . . (ලිපිනය) හි පදිංචි .. . . . . .. . . .. . . . . . .. . . . . . .. . . . . . . . . . . . යන අය අනිච්ඡානුගම ඇතුළත් කිරීම සඳහා නිර්දේශය.

1. . . . . . . . . . . . .. .. . . . . . . . . . . . හි පදිංචි . . . . . . . . . . . . වන මා පහත පරිදි ප්‍රකාශ කර සිටිමි.

(අ) මම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වෙමි.

(ආ) එකී . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . යන අය මා විසින් 20. . . . . . . . .. .. . . . . . . මස . . . . . දින පරීක්ෂා කරන ලදී.

(ඇ) මෙම තැනැත්තා . . . . . . . . . . . .. . . . . පෙළෙන බව මා විසින් නිගමනය කරන ලදී. එම තැනැත්තා මා විසින් පරීක්ෂා කරනු ලැබීමේදී පහත සඳහන් රෝග ලක්ෂණයන් සහ සලකුණු මා විසින් නිරීක්ෂණය කරන ලදී.

අනිච්ඡානුග ඇතුළත් කිරීමක් අවශ්‍යවීමට හේතු :-

2. මා තවදුරටත් පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටිමි.

(අ) එකී . . . . . . . . .. . . . .. . . . . . . . . යන අය

(i) මානසික අසනීපයකින් පෙළේ.

(ii) පහසුකම් ආයතනය මගින් ප්‍රතිකාර කිරීම අවශ්‍ය වේ.

(iii) එවැනි ප්‍රතිකාරයක් සඳහා කැමැත්ත ලබාදීම සඳහා මෙම අවස්ථාවේදී නොහැකියාවෙන් පසුවේ.

(ආ) එකී . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . යන අය ඉක්මණින් ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සඳහා ඔහු හෝ ඇය මානසික සෞඛ්‍ය පනත මගින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා . . . . . . . . . . . . .. .. වෙත ඇතුළත් කළ යුතුය.

අත්සන් කළේ : . . . . . . . . . .. . . .. . . .

වෛද්‍ය සුදුසුකම් :. . . . . . .. . . . . . . ..

දිනය : . . . .. . . . . . . .. . . . . . . . . ..

* යම් තැනැත්තකු ඔහුගේ හෝ ඇයගේ නිගමනයන් පදනම්වූ හේතු නිශ්චය කිරීමේදී ඔහුගේ හෝ ඇයගේ නිරීක්ෂණයන් මත පදනම් වූ කරුණු පිළිබඳ ප්‍රකාශයන් සහ වෙනත් අය විසින් ඔහු වෙත සන්නිවේදනය කරන ලද කරුණු පිළිබඳ ප්‍රකාශයන් අතර වෙනස ප්‍රවේසමෙන් හඳුනාගත යුතුය.

අනිච්ඡානුග රඳවා තබාගැනීම දීර්ඝ කිරීම සඳහා ආකෘතිය
(42 වග)

. . . . .. . . . .. .. .. . . . .. . . . . . . .. . . . . . . . .. . . . .. . . . . . . . . .. .
(ලිපිනය) හි පදිංචි . . . . .. . . . . . .. . . . . .. . . . . . . .. . . . . . . . . . යන අය තවදුරටත් රඳවා ගැනීම සඳහා නිර්දේශය.

3. . . . . . . . . . . . . . . . . . .. . . . . . . . .. . . . . . . . .. . . හි පදිංචි . . . . . . . . . .. . . . . . . .. . . . . . . .. . . . . .. . . වන මම පහත සඳහන් පරිදි මෙයින් ප්‍රකාශ කර සිටිමි.

(අ) මම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වෙමි.

(ආ) එකී . . . .. . . . .. . . . . . . .. . . . . . . . .. . . . යන අය මා විසින් 20. . . . . .. . . . . . . . . . . මස. . . . . දින පරීක්ෂා කරන ලදී.

(ඇ) මෙම තැනැත්තා . . . . . . . . . . . . . . . . . . පෙළෙන බව මා විසින් නිගමනය කරන ලදී. එම තැනැත්තා මා විසින් පරීක්ෂා කරනු ලැබීමේදී පහත රෝග ලක්ෂණයන් සහ සලකුණු මා විසින් නිරීක්ෂණය කරන ලදී.

. . . .. . . . . . . . . . .. . . . . . . . . . . .. . . .කාලපරිච්ඡේදයක්

සඳහා තවදුරටත් අනිච්ඡානුගව ඇතුළත් කිරීම පහත සඳහන් කරුණු නිසා අවශ්‍ය වේ :

4. මා තවදුරටත් පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටිමි.

(අ) එකී . . . . . . . . .. . . . . .. . . . . . . . . යන අය
   (i) මානසික අසනීපයකින් පෙළේ.
   (ii) පහසුකම් ආයතනය මගින් ප්‍රතිකාර කිරීම අවශ්‍ය වේ.
   (iv) එවැනි ප්‍රතිකාරයක් සඳහා කැමැත්ත ලබාදීම

සඳහා මෙම අවස්ථාවේදී නොහැකියාවෙන් පසුවේ.

(ආ) එකී . . . . . . . . . . . . . . . .. . . . . . . . . යන අය ඉක්මණින් ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සඳහා ඔහු හෝ ඇය මානසික සෞඛ්‍ය පනත මගින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා . . . . . . . . . . . .. .. වෙත ඇතුළත් කළ යුතුය.

අත්සන් කළේ : . . . . . . . . . .. . . .. . .
වෛද්‍ය සුදුසුකම් :. . . . . .. . . . . . ..
දිනය : . . . .. . . . . . .. . . . . . . . . ..

* යම් තැනැත්තකු ඔහුගේ හෝ ඇයගේ නිගමනයන් පදනම්වූ හේතු නිශ්චය කිරීමේදී ඔහුගේ හෝ ඇයගේ නිරීක්ෂණයන් මත පදනම් වූ කරුණු පිළිබඳ ප්‍රකාශයන් සහ වෙනත් අය විසින් ඔහු වෙත සන්නිවේදනය කරන ලද කරුණු පිළිබඳ ප්‍රකාශයන් අතර වෙනස ප්‍රවේසමෙන් හඳුනාගත යුතුය.

<u>විද්‍යුත් කම්පන චිකිත්සාව සඳහා ආකෘති පත්‍රය (ECT)</u>

<u>( 45 වග)</u>

රෝගියා

නම:

ලිපිනය :

උපන් දිනය :
දුරකථන අංකය :

ළගම ඥාතියා :
නම :
රෝගියාට ඇති ඥාති සබඳතාවය :
ලිපිනය :
දුරකථන අංකය :

මානසික වෛද්‍ය විශේෂඥ
රෙජිස්ට්‍රාර් / වෛද්‍ය නිලධාරි

<u>ස්වෙච්ජා විද්‍යුත් කම්පන චිකිත්සා ප්‍රතිකාරය</u>

. . . . . . . . . . . . . .. . . . . . . . .. . . . . . . . . . . . . . .. . ( රෝගියාගේ නම ) යන අයට . . . . .. . . . . . . . . . . . .. . . . . . . ප්‍රතිකාර කිරීම සඳහා විද්‍යුත් කම්පන ප්‍රතිකාරය අවශ්‍ය වන බවට මා විසින් පෞද්ගලිකව පරීක්ෂා කොට තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

බී පහත සඳහන් හේතු නිසාය :

මනෝ චිකිත්සකවරයාගේ නම :
අත්සන :
වෛද්‍ය සුදුසුකම් :
දිනය :

රෝග විනිශ්චය, විද්‍යුත් කම්පන චිකිත්සාව ( ECT) නිර්දේශිත ප්‍රතිකාරය වන්නේ ඇයි, විද්‍යුත් කම්පන චිකිත්සාවට (ECT)ඇතුළත් වන දේ කවරේද , ඒ පිළිබඳ තොරතුරු, අවදානම් හා ප්‍රතිලාභ, රෝගියා වෙත විකල්ප ප්‍රතිකාරයන් ලබාදෙන ලද්දේ

වෛද්‍යවරයාගේ නම :

දිනය :

අත්සන :

. . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . (රෝගියාගේ නම) වන මා විද්‍යුත් කම්පන චිකිත්සා ප්‍රතිකාරය සඳහා මෙයින් එකඟත්වය ප්‍රකාශ කර සිටිමි. *

* එකඟත්වය ලබාදීම සඳහා රෝගියාගේ හැකියාව තහවුරු කරනු ලබන හැකියාව පිළිබඳ ආකෘති පත්‍රය මෙයට ඇමිණිය යුතුය.

අත්සන් කළේ :

දිනය :

රෝගියාගේ නම :

<u>අනිච්ඡානුග විද්‍යුත් කම්පන චිකිත්සා ප්‍රතිකාරය</u>

. . . . . . . . . . . . . . .. . . . . . . . . . .. . . . . . . . . (රෝගියාගේ නම ) යන අයගේ . . . . .. . . . . . . . . . . . .. . . . . . . . . . . . . . සඳහා ප්‍රතිකාර කිරීම සඳහා විද්‍යුත් කම්පන චිකිත්සා ප්‍රතිකාරය (ECT) අනිච්ඡානුග පදනමකින් ලබාදීම අවශ්‍ය වන බවට මා විසින් පෞද්ගලිකව පරීක්ෂා කොට තීරණය කරන ලද බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

පහත සඳහන් හේතු නිසා :-

මානසික රෝග විශේෂඥවරයාගේ නම :

අත්සන :

වෛද්‍ය සුදුසුකම් :

දිනය :

. . . . . . . . .. . . . . . . . . . . . . .. . . . . . . . .. . . . ( රෝගියාගේ නම ) යන අයගේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . සඳහා ප්‍රතිකාර කිරීම සඳහා විද්‍යුත් කම්පන චිකිත්සා ප්‍රතිකාරය (ECT) අනිච්ඡානුග පදනමකින් ලබාදීම අවශ්‍යය වන බවට මා විසින් පෞද්ගලිකව පරීක්ෂා කොට තීරණය කරන ලද බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

පහත සඳහන් හේතු නිසා :

අනෙක් වෛද්‍ය වෘත්තිකයාගේ නම :

අත්සන :

වෛද්‍ය සුදුසුකම් :

දිනය :